# 2022 සැප්තැම්බර් මස 20 වන දින ගඟ ඉහළකෝරලේ ප්‍රාදේශීය සභාවේ පැවති

# මහා සභා රැස්වීම් වාර්තාව

දිනය සහ වේලාව :- 2022.09.20 පෙ:ව: 09.30

ස්ථානය :- ගඟ ඉහළ කෝරලේ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව

පැමිණීම:-

| | |
|---|---|
| 01. පී.ඕ.පී.ඩී. නදීර බණ්ඩාර ජයසේකර මහතා | ගරු ප්‍රාදේශීය සභා සභාපති |
| 02. ඒ. මහින්දරත්න අලුත්ගමගේ මහතා | ගරු ප්‍රාදේශීය සභා උප සභාපති |
| 03. ආර්.පී. ගුණරත්න මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 04. එස්.ඒ.ඩබ්. පතිරණ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 05. ඩී.ඩබ්.නාලක වසන්ත අබේසේකර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 06. එම්.පී.ප්‍රසන්න විමල් මනතුංග මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 07.චන්ද්‍රා අලුත්ගමගේ මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 08.ඒ.පී. කොල්වින් සිල්වා මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 09. ඩී.පී.පී. විශ්වජිත් ගංගා ප්‍රේමලාල් ගුරුගේ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 10. සුබෝධා ලක්ෂාණි රිබේරා මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 11. ඩබ්.එම්. උදය කුමාර බණ්ඩාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 12. ඒ.ඒ. අජිත් ප්‍රියන්ත බණ්ඩාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 13. ආර්.එම්.චාමික අනුරාධ රත්නායක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 14. එම්.ඒ. සුමේධ අලුත්ගමගේ මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 15. පූජ්‍ය පට්ටිපොල සුමනරතන හිමි | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 16. එච්.පී. ආනන්ද කුලතිලක මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 17. එම්.පී. අබේරත්න බණ්ඩාර මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 18. එස්. නිලාම් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 19. ඩී.පී. නිරෝෂා දිල්රුක්ෂිකා ජයසේකර මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 20. එස්.පී. සරත් කුමාර ලාල් මහතා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 21. රාජකුමාර් විදුෂණී මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 22. එන්.එම්. නන්දාවතී මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 23. ආර්.පී. පී. ඉෂංකා ලක්මාලි සෙනෙවිරත්න මහත්මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |

ගරු සභාපතිතුමා

ගරු සභාපතිතුමා විසින් මහා සභා රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරමින් පැමිණ සිටි ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා, ගරු මන්ත්‍රීතුමියන්ලා, ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය ඇතුළු නිලධාරීන් සියලුදෙනා හා පැමිණ සිටි සියලුදෙනාම ගෞරවයෙන් යුතුව පිළිගන්නා ලදී. සභා රැස්වීමට සහභාගීවූ සියල්ලෝම තම ආගම සිහිකර ජාතික ගීය ගායනා කිරීමෙන් පසුව මියගිය රණවිරුවන් හා මියගිය පළාත් පාලන ආයතන නියෝජිතයින් සිහිකර විනාඩියක නිශ්ශබ්දතාවයක් පවත්වන ලදී. ඉන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් න්‍යායපත්‍රානුකූලව පසුගිය සභා වාර්තාව ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

## 01.පසුගිය සභා වාර්තාව සම්මත කර ගැනීම

2022 අගෝස්තු මස 16 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සම්මත කර ගැනීමට ගරු සභාපතිතුමා විසින් ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.ඩබ්. පතිරණ මහතා

ගරු සභාපතිතුමනි, පසුගිය සභා වාර්තාවේ පිටු අංක 13හි සඳහන් ගෙවීම් වාර්තාවේ ඩීසල් ලීටර් 200ක් වශයෙන් සඳහන් කර ඇති බැවින් එය ලීටර් 100ක් වශයෙන් සංශෝධනය විය යුතුයි.

ගරු සභාපතිතුමා

එය සංශෝධනය කරන ලෙස නිලධාරීන්ට උපදෙස් ලබාදෙනවා. වෙනත් සංශෝධන ඇත්නම් ඉදිරිපත් කරන ලෙසත් එසේ නොමැතිනම් පසුගිය සභා වාර්තාව සම්මත කිරීම සුදුසුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී. ගුණරත්න මහතා

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද 2022.08.16 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සංශෝධන වලට යටත්ව සත්‍ය වාර්තාවක් බවට මා විසින් යෝජනා කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.පී. ආනන්ද කුලතිලක මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

යෝජනා ස්ථිරත්වයෙන් අනතුරුව 2022.08.16 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සංශෝධන වලට යටත්ව ඒකමතිකව සභා සම්මත විය.

## 02. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන - ඇත

01. අංක KDB/E/PS-GIK/05/2021/781 හා 2022-06-30 දිනැති ලිපිය මගින් විගණකාධිපති විසින් යොමු කරන ලද ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11 (1) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව සභාගත කරමි.

තත්ත්වාගණනය කළ මතය

"මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර,මූල්‍ය ප්‍රකාශන වලින් 2021 දෙසැම්බර් 31 දිනට ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන්

වර්ෂයඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.”

02. පළාත් පාලන ආයතන තුළ පවතින සභා අරමුදල වෙනුවෙන් පවත්වා ගෙන යනු ලබන ජංගම ගිණුම් සඳහා **Sweep** (ස්වීප්) ක්‍රමය යටතේ ඉතිරි කිරීමේ ගිණුමක් ආරම්භ කිරීමෙන් අමතර පොළී මුදලක් උපයා ගැනීමට හැකියාව තිබෙන බැවින් අප ආයතනයට ද මෙම ක්‍රමය භාවිතා කරන ලෙස දන්වමින් පළාත් පාලන කොමසාරිස් විසින් ඉදිරිපත් කළ ලිපිය සභාගත කරමි.

03.පැරණි ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල පිහිටි ස්ථානයේ නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සම්බන්ධව සිදුකරන ලද විමර්ශනය අනුව පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ ඇතුළත් පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අංක **CPC/ACLG/K/AM/10/01/11** හා 2022-08-26 දිනැති ලිපිය සභාගත කරමි.

04. ගම්පොළ නගර සභාව මගින් උලපනේ ඩෙන්මාර්ක් කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයට කසළ බැහැර කිරීම සම්බන්ධව ගරු සභිකයින් දැනුවත් කිරීමේ සාකච්ඡාවක් 2022-09-20 දින පෙ.ව.11.00 ට පැවැත්වෙන බවත් ඒ සඳහා ගරු සභිකයින් හා නිලධාරීන් සමග සහභාගිවන ලෙස දන්වමින් පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් යොමු කරන ලද ලිපිය සභාගත කරමි.

පෙ.ව.09.50ටගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී.ප්‍රසන්න විමල් මනතුංග මහතා සභා ගර්භයට පැමිණියේය.

පෙ.ව.09.52ට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනීආර්.පී. පී. ඉෂංකා ලක්මාලි සෙනෙවිරත්න මහත්මිය සභා ගර්භයට පැමිණියාය.

<u>03. සභාවට ලැබී ඇති සංදේශ, පෙත්සම්, පැමිණිලි, හා සන්නිවේදන - නැත</u>

<u>04. යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න - ඇත</u>

<u>I. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී. ගුණරත්න මහතා විසින් ඉදිරිපත් කරන ලද ප්‍රශ්න</u>

සභාවේ සුසාන භූමි. ප්‍රජා ශාලාවල, රජයේ ඉඩම් පිළිබඳ වාර්තා සභාවට ඉදිරිපත් කිරීම

<u>ඉහත ගැටළු සඳහා අදාළ පිළිතුරු:-</u>

<u>01.සුසාන භූමි</u>

| සුසාන භූමි - ප්‍රගතිය | | | |
|---|---|---|---|
| අනු අංකය | විස්තරය | ප්‍රගතිය | ඇමුණුම |
| 1 | **1961/8/18** වන දින අංක **12609** ගැසට් පත්‍රය මගින් ප්‍රාදේශීය සභාවට පවරා ඇති සුසාන භූමි | ප්‍රාදේශිය සභාවට පවරා ඇති සුසාන භූමි -14 න් සුසාන භූමි 02ක් ගම්පොල නගර සභාවට පවරා දී ඇත. | ඇමුණුම -01 |
| | | 1. ප්‍රාදේශිය සභාවට පවරා ඇති සුසාන භූමි 12න් සුසාන භූමි 11 ක මැනුම් කටයුතු සිදුකර ඇත | ඇමුණුම -02 |
| | | 2.මැනුම් කටයුතු සිදුකර ඇති සුසාන භූමි 10ක් වෙනුවෙන් ප්‍රකාශන ඔප්පු සකස් කරගැනිම සඳහා නීතිඥ මහතා වෙත යොමු කර ඇත. | ඇමුණුම -03 |

| | | | |
|---|---|---|---|
| 2 | 2022 වර්ෂය වන විට මිනුම් කටයුතු අවසන් කර ඇති සුසාන භූමි | 2022 වර්ෂය වන විට සුසාන භූමි 18 ක මැනුම් කටයුතු සිදුකර පිඹුරුපත් සකස් කර ඇත. | ඇමුණුම -02 |
| 3 | ගඟ ඉහළ කොරළේ ප්‍රාදේශිය ලේකම්ගෙන් ප්‍රාදේශිය සභාව වෙත පවරා ගැනිම සඳහා කටයුතු කර ඇති සුසාන භූමි | සුසාන භූමිය 20 ක් නෛතිකව ප්‍රාදේශිය ලේකම්ගෙන් පවරා ගැනිම සඳහා පළාත් පාලන කොමසාරිස්ගේ එකගතාවය, මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශය සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි නිර්දේශය ප්‍රාදේශිය ලේකම් වෙත ලබා දිමට කටයුතු කර ඇත | ඇමුණුම -04 |
| 4 | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් ප්‍රාදේශිය සභාව වෙත පවරා ගැනිම සඳහා ඉල්ලිම් කර ඇති සුසාන භූමි | 1.ඉඩම් ප්‍රතිසංසකරණ කොමිෂන් සභාවට අයත් සුසාන භූමිය 16 ක් පවරා ගැනිම සඳහා දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩලයේ අධ්‍යක්‍ෂ වෙත ලිඛිතව ඉල්ලිමක් කර ඇත.<br><br>2.ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සභාපති විසින් සුසාන භූමි 04 ක් ප්‍රාදේශීය සභාවට පවරා දිම සඳහා ප්‍රාදේශිය සභාව මගින් මැනුම් ගාස්තු ගෙවිමට යටත්ව මැනුම් කටයුතු සිදුකිරිමට අවශ්‍ය කටයුතු කර ඇත | ඇමුණුම -05<br><br>ඇමුණුම -06 |

## 1. 1961/8/18 වන දින අංක 12609 ගැසට් පත්‍රය මගින් ප්‍රාදේශීය සභාවට පවරා ඇති සුසාන භූමි -14

1961 අගෝස්තු 18 දින ලංකා ආණ්ඩුවේ අංක 12609 ගැසට් පත්‍රය මගින් ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් සුසාන භූමි 14 ක් ප්‍රකාශයට පත් කර ඇත. සුසාන භූමි 12 ක් ප්‍රාදේශිය සභාව යටතේ පවතින අතර සුසාන භූමි 02 ක් ගම්පොල නගර සභාවට පවරා ඇත.

ප්‍රාදේශිය සභාව යටතේ පවතින සුසාන භූමි-12

1.පැල්ලැපිටිය ගමේ පිහිටි මුඩේගොඩ සුසාන භූමිය

2.උඩුවැල්ල ගමේ පිහිටි වැටකේදෙණිය කන්ද සුසාන භූමිය

3.පිටකන්ද ගමේ පිහිටි රන්දුනුගල පතන සුසාන භූමිය

4. මීතලාව ගමේ පිහිටි මැදිකැලේ සුසාන භූමිය

5. හතුගොඩ ගමේ පිහිටි හතුගොඩ සුසාන භූමිය

6.හැරකොල ගමේ පිහිටි පිං කොටුව සුසාන භූමිය

7. ගල්පාය ගමේ පිහිටි අඹගස්තැන්න සුසාන භූමිය

8. අළුගොල්ල ගමේ පිහිටි කිරිගහපතන සුසාන භූමිය

9. තැඹිලිගල උඩගම පිහිටි නාගොල්ලහේන සුසාන භූමිය

10. හලාගම පිහිටි පිටපැල සුසාන භූමිය

11. යටපාන ගමේ පිහිටි ග්‍රෙස්ලන්ඩ් වත්තේසුසාන භූමිය

12. ගම්පොලවෙල ඉහළගම ගමේ පිහිටි - වාගොල්ල

ගම්පොල නගර සභාවට පවරා ඇති සුසාන භූමි

13.කුඩමාකේ ගමේ පිහිටි කුඩමාකේ සුසාන භූමිය

14.ඇරැගොඩ ගමේ පිහිටි අඹකොටේ සුසාන භූමිය

ගඟ ඉහළ කොරළේ ප්‍රාදේශිය ලේකම්ගෙන් ප්‍රාදේශිය සභාව වෙත පවරා ගැනිමට කටයුතු කර ඇති සුසාන භූමි -20

| අනු අංකය | සුසාන භූමියේ නම | ප්‍රගතිය |
|---|---|---|
| 01 | හල්දොලපතන සුසාන භූමිය | සුසාන භූමිය නෛතිකව ප්‍රාදේශිය ලේකම්ගෙන් පවරා ගැනිම සඳහා පළාත් පාලන කොමසාරිස්ගේ එකගතාවය, මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශය සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි නිර්දේශය ප්‍රාදේශිය ලේකම් වෙත ලබා දිමට කටයුතු කර ඇත |
| 02 | ඩෙන්මාර්ක් ජනපද සුසාන භූමිය | |
| 03 | හලාගම පිටපෑල සුසාන භූමිය | |
| 04 | ගැමුණපුර ඉරහඳ සුසාන භූමිය | |
| 05 | අට්ටමල් ජනපද සුසාන භූමිය | |
| 06 | තාමරවැලි සුසාන භූමිය | |
| 07 | ගලමුදුන සුසාන භූමිය | |
| 08 | විලඋඩවත්ත සුසාන භූමිය | |
| 09 | වැටකේදෙණිය මැදගොඩ සුසාන භූමිය | |
| 10 | වැටකේදෙණිය පොදු සුසාන භූමිය | සුසාන භූමිය නෛතිකව ප්‍රාදේශිය ලේකම්ගෙන් පවරා ගැනිම සඳහා පළාත් පාලන කොමසාරිස්ගේ එකගතාවය, මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශය සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි නිර්දේශය ප්‍රාදේශිය ලේකම් වෙත ලබා දිමට කටයුතු කර ඇත |
| 11 | යටපාන ගමේ පිහිටි ග්‍රේස්ලන්ඩ් සුසාන භූමිය | |
| 12 | හැරකොල පිං කොටුව සුසාන භූමිය | |
| 13 | පිටකන්ද රන්දුනුගල පතන සුසාන භූමිය | |
| 14 | ගල්පාය අඹගස් තැන්න සුසාන භූමිය | |
| 15 | පිටකන්ද මුකලාන සුසාන භූමිය | |
| 16 | ගම්පොලවෙල හුලවාලියාවත්ත සුසාන භූමිය | |
| 17 | උලපනේ බෝගොල්ල සුසාන භූමිය | |
| 18 | ලැන්ටන්හිල් B ජනපද සුසාන භූමිය | |
| 19 | ජැක්ට්‍රිහිල් සුසාන භූමිය | |
| 20 | ඇත්ගාල නැගෙනහිර සුසාන භූමිය | |

2. ගඟ ඉහළ කොරළේ ප්‍රාදේශීය සභාව මගින් මැනුම් කර ඇති සුසාන භූමි -18

| අනු අංකය | සුසාන භූමියේ නම | ගැසට් කර ඇති සුසාන භූමි (√) | ගම | පිඹුරු අංකය |
|---|---|---|---|---|
| 1 | මුඩේගොඩ සුසාන භූමිය | √ | පැල්ලපිටිය | 294 |
| | වැටකේදෙණිය කන්ද සුසාන භූමිය | √ | උඩුවැල්ල | 9506 |
| 3 | මැදිකැලේ සුසාන භූමිය | √ | මීතලාව | 1393 |
| 4 | හතුගොඩ සුසාන භූමිය | √ | හතුගොඩ | 1166 |
| 5 | අඹගස්තැන්න සුසාන භූමිය | √ | ගල්පාය | 9504 |
| 6 | කිරිගහපතන සුසාන භූමිය | √ | අලුගොල්ල | 1032 |
| 7 | නාගොල්ලහේන සුසාන භූමිය | √ | තැඹිලිගල උඩගම | 9508 |

| | | | | |
|---|---|---|---|---|
| 8 | පිටපෑල සුසාන භූමිය | √ | හලාගම | 9507 |
| 9 | ග්‍රේස්ලන්ඩ් වත්තේ සුසාන භූමිය | √ | යටපාන ගම | මහ 309 |
| 10 | වාගොල්ල නොහොත් හපුගහදෙණිය සුසාන භූමිය | √ | ගම්පලවෙල ඉහළගම | 1033 |
| 11 | හැරකොල පිං කොටුව | √ | හැරකොල | 1163 |
| 12 | තැඹිලිගල වත්තේ සුසාන භූමිය | | තැඹිලිගල උඩගම | 1437 |
| 13 | ජැක්ට්‍රීහිල් සුසාන භූමිය | | වරකාවල | 9505 |
| 14 | වල්ලහගොඩ සුසාන භූමිය | | වල්ලහගොඩ | 5459 |
| 15 | මල්වත්තගම සුසාන භූමිය | | මල්වත්තගම | මහ 2296 |
| 16 | ගැමුණුපුර සුසාන භූමිය | | ගැමුණුපුර | 1454 |
| 17 | මැදගොඩවත්තේ ඉහළ කොටසේ පොදු සුසාන භූමිය | | මැදගොඩ ඉහළ | 1455 |
| 18 | උඩහේන්තැන්න ක්‍රේහෙඩ් සුසාන භූමිය | | උඩහේන්තැන්න | 2268 |

**04,ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් ප්‍රාදේශීය සභාවට පවරා ගැනිම සඳහා මැනුම් ගාස්තු ගෙවිමට යටත්ව මැනුම් කිරිමට කටයුතු කර ඇති සුසාන භූමි-04**

| අනු අංකය | ඉඩමේ නම | ප්‍රමාණය | සුසාන භූමියේ නම | ප්‍රගතිය |
|---|---|---|---|---|
| 01 | ඇපලවත්ත | අක්කර 1 1/2 (දළ වශයෙන්) | ඇපලවත්ත සුසාන භූමිය | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් ප්‍රාදේශීය සභාවට පවරා ගැනිම සඳහා මැනුම් ගාස්තු ගෙවිමට යටත්ව මැනුම් කිරිමට කටයුතු කර ඇත. |
| 02 | කුරුඳුවත්ත | අක්කර 1 1/4 (දළ වශයෙන්) | මල්වත්තගම සුසාන භූමිය | |
| 03 | ක්‍රේහෙඩ් වත්ත | අක්කර 1 1/2 (දළ වශයෙන්) | උඩහේන්තැන්න ක්‍රේහෙඩ් සුසාන භූමිය ( කහවත්ත වැවිලි සමාගම) | |
| 04 | තැඹිලිගල වත්ත | | තැඹිලිගල වත්ත සුසාන භූමිය හා ශ්‍රිධරන්පුර සුසාන භූමිය | |

**04.2021 වර්ෂයේ ප්‍රකාශන ඔප්පු ලබාගැනිමට කටයුතු කර ඇති සුසාන භූමි**

| අනු අංකය | සුසාන භූමියේ නම | ගැසට් පත්‍රයේ සඳහන් අංකය | ඔප්පු කර ඇති දිනය | ඔප්පු පත් අංකය |
|---|---|---|---|---|
| 1 | පැල්ලැපිටිය ගමේ පිහිටි - මුඩේගොඩ සුසාන භූමිය | 1 | 2010.03.02 | 294 |
| 2 | උඩුවැල්ල ගමේ පිහිටි - වැටකේදෙනිය කන්ද සුසාන භූමිය | 2 | 2020.09.30 | 9506 |
| 3 | මීතලාව ගමේ පිහිටි - මැදිකැලේ සුසාන භූමිය | 4 | 2015.01.05 | 1393 |
| **4** | හකුගොඩ ගමේ පිහිටි- හකුගොඩ සුසාන භූමිය | **5** | **2019.09.05** | **1116** |
| **5** | ගල්පාය ගමේ පිහිටි අඹගස්තැන්න සුසාන භූමිය | **8** | **2020.09.28** | **9504** |
| **6** | අළුගොල්ල ගමේ පිහිටි | **9** | **2018.12.31** | **1032** |

| | | | | |
|---|---|---|---|---|
| | කිරිගහපතන සුසාන භූමිය | | | |
| **7** | තැඹිලිගල උඩගම පිහිටි - නාගොල්ලහේන සුසාන භූමිය | **10** | **2020.12.17** | **9508** |
| **8** | හලාගම පිහිටි - පිටපැල සුසාන භූමිය | **11** | **2020.10.07** | **9507** |
| **9** | යටපාන ගමේ පිහිටි - ග්‍රේස්ලන්ඩ් වත්තේසුසාන භූමිය | **13** | **1968.02.19** | මහ **309** |
| **10** | ගම්පොලවෙල ඉහළගම ගමේ පිහිටි - හුලවාලියාවත්ත සුසාන භූමිය(වාගොල්ල නොහොත් හපුගහදෙණිය) ගම්පලවෙල | **14** | **2018.12.27** | **1033** |

## 02.ක්‍රීඩාපිටි

1.ගඟ ඉහළ කොරලේ ප්‍රාදේශිය ලේකම්ගෙන් ප්‍රාදේශිය සභාව වෙත පවරා ගැනිමට කටයුතු කර ඇති ක්‍රීඩාපිටි -05

| අනු අංකය | ක්‍රිඩාපිටියේ නම | ප්‍රගතිය |
|---|---|---|
| 01 | රජ ඇළගම ක්‍රීඩාපිටිය | ගඟ ඉහළ කොරලේ ප්‍රාදේශිය ලේකම්ගෙන් ක්‍රීඩාපිටිය නෛතිකව පවරා ගැනිම සඳහා ප්‍රාදේශිය ලේකම් විසින් අවශ්‍ය බව දන්වා ඇති පළාත් පාලන කොමසාරිස්ගේ ඉල්ලිම් ලිපිය ප්‍රාදේශිය ලේකම් වෙත ලබා දිමට කටයුතු කර ඇත |
| 02 | අට්ටමල් ජනපද ක්‍රීඩාපිටිය | |
| 03 | පිටකන්ද ක්‍රීඩාපිටිය | |
| 04 | මැදගොඩ ක්‍රීඩාපිටිය | |
| 05 | ඇත්ගාල ක්‍රීඩාපිටිය | |

02. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් ප්‍රාදේශිය සභාවට පවරා ගැනිම සඳහා මැනුම් ගාස්තු ගෙවිමට යටත්ව මැනුම් කිරිමට කටයුතු ඇති ක්‍රීඩා පිටි 05

| අනු අංකය | ඉඩමේ නම | ප්‍රමාණය | ක්‍රීඩාපිටිය | ප්‍රගතිය |
|---|---|---|---|---|
| 01 | ගෝනවත්ත | අක්කර 1 (දළ වශයෙන්) | ගැමුණුපුර සුවඳගල ක්‍රීඩාපිටිය | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් ප්‍රාදේශිය සභාවට පවරා ගැනිම සඳහා මැනුම් ගාස්තු ගෙවිමට යටත්ව මැනුම් කිරිමට කටයුතු කර ඇත. |
| 02 | තැඹිලිගල වත්ත | අක්කර 1 1/2 (දළ වශයෙන්) | තැඹිලිගල වත්ත ක්‍රීඩාපිටිය (සාර්ක්) | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් ප්‍රාදේශිය සභාවට පවරා ගැනිම සඳහා මැනුම් ගාස්තු ගෙවිමට යටත්ව මැනුම් කිරිමට කටයුතු කර ඇත. |
| 03 | ක්‍රේහෙඩ් වත්ත | අක්කර 1/2 (දළ වශයෙන්) | උඩහේන්තැන්න අඹ ගස් ලැයිම ක්‍රීඩාපිටිය | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් ප්‍රාදේශිය සභාවට පවරා ගැනිම සඳහා මැනුම් ගාස්තු ගෙවිමට යටත්ව මැනුම් කිරිමට කටයුතු කර ඇත. |
| 04 | ක්‍රේහෙඩ් වත්ත | අක්කර 1/2 (දළ වශයෙන්) | ක්‍රේහෙඩ් උඩකොටස ක්‍රීඩාපිටිය | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් ප්‍රාදේශිය සභාවට පවරා ගැනිම සඳහා මැනුම් ගාස්තු ගෙවිමට යටත්ව මැනුම් කිරිමට කටයුතු කර ඇත. |
| 05 | මල්ගොල්ල වත්ත | අක්කර 1 (දළ වශයෙන්) | මල්ගොල්ල ක්‍රීඩාපිටිය | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් ප්‍රාදේශිය සභාවට පවරා ගැනිම සඳහා මැනුම් ගාස්තු ගෙවිමට යටත්ව මැනුම් කිරිමට කටයුතු කර ඇත. |

| අනු අංකය | ක්‍රීඩාපිටි | වසම | ප්‍රගතිය |
|---|---|---|---|
| **01** | පරගල පොදු ක්‍රීඩාපිටිය | රාක්ෂාව | දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩලයේ අධ්‍යක්ෂ වෙත ක්‍රීඩාපිටිය පවරා ගැනිම සඳහා ඉල්ලීම් කර ඇත. |
| **02** | පෙනිලන් පොදු ක්‍රීඩාපිටිය | අළුගොල්ල | |
| **03** | කොහොවල ක්‍රීඩා පිටිය | කොහොවල | |
| **04** | කෙළිගෲප් ක්‍රීඩාපිටිය | කෙළිගෲප් | |
| **05** | දොළොස්බාගේ ක්‍රීඩාපිටිය | මියනගොල්ල | |
| 06 | කොළුවල ක්‍රීඩාපිටිය | පැල්ලැපිටිය දකුණ | |

| අනු අංකය | ප්‍රජාශාලාවේ නම | වසම | ප්‍රගතිය |
|---|---|---|---|
| 01 | තැලිහුන්න ගම එක්සත් සුභ සාධක සංගමයේ ප්‍රජා ශාලාව | මල්වත්තගම | ප්‍රජා ශාලාව ප්‍රාදේශීය සභාව වෙත පවරා ගැනිම සඳහා ගඟ ඉහළ කොරළේ ප්‍රාදේශීය ලේකම් වෙත ඉල්ලීම් ලිපිය යොමු කර ඇත. |
| 02 | පෙනිලන් ප්‍රජාශාලාව | අළුගොල්ල | |
| 03 | අළුගොල්ල ප්‍රජාශාලාව | ගල්පාය | |
| 04 | රජඇළ ප්‍රජාශාලාව | පැල්ලැපිටිය දකුණ | |
| 05 | පැල්ලැපිටිය ප්‍රජාශාලාව | පැල්ලැපිටිය උතුර | |
| 06 | පටිතලාව ප්‍රජාශාලාව | පටිතලාව | |
| 07 | බෝගොල්ල ප්‍රජාශාලාව | උලපනේ දකුණ | |
| 08 | මීතලාව ප්‍රජාශාලාව | ගිරාඋල්ල | |
| 09 | ලැන්ටන්හිල් ප්‍රජාශාලාව | ගල්පාය | |
| 10 | උලපනේ සුදර්ශනාරාම ප්‍රජාශාලාව | උලපනේ උතුර | |
| 11 | අම්බලපිටිය ප්‍රජාශාලාව | මල්වත්තගම | |
| 12 | මියනගොල්ල ප්‍රජාශාලාව | මියනගොල්ල | |
| 13 | පිටකන්ද ප්‍රජාශාලාව | පිටකන්ද | |
| 14 | කැලිප්නපද ප්‍රජාශාලාව | කෙළිගෲප් | |
| 15 | උඩගල්පායේ ප්‍රජාශාලාව | ගල්පාය | |
| 16 | ඇත්ගාල ප්‍රජාශාලාව | ඇත්ගාල නැගෙනහිර | |
| 17 | කොස්ගොල්ල ප්‍රජාශාලාව | වල්හගොඩ | |

| | | | |
|---|---|---|---|
| 18 | කොලුවල ප්‍රජාශාලාව | පැල්පිටිය දකුණ | |
| 19 | ඇත්ගාල බටහිර ප්‍රජාශාලාව | ඇත්ගාල බටහිර | |
| 20 | සුවඳගල ප්‍රජාශාලාව | ගැමුණුපුර | |
| 21 | වරකාපිටිය ශ්‍රී බෝධිරුක්කාරාම ප්‍රජා ශාලාව | තැඹිලිගල | |
| 22 | බොස්වර්ඩ් ප්‍රජාශාලාව | වැටකේදෙණිය | |
| 23 | විජයගම ප්‍රජාශාලාව | රාක්ෂාව | |
| 24 | කුරුදුවත්ත අත්කම් නිවාස ප්‍රජාශාලාව | මල්වත්තගම | |
| 25 | වැටකේදෙණිය ප්‍රජාශාලාව | වැටකේදෙණිය | |
| 26 | උද්දල්තුඩුව ප්‍රජාශාලාව | මල්වත්තගම | |
| 27 | ලෙව්වම්වත්ත ප්‍රජාශාලාව | පැල්ලපිටිය උතුර | |

## ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව මගින් දැනට භුක්ති විඳින ඉඩම් සම්බන්ධ තොරතුරු

| අනු අංකය | භුක්ති විඳින ඉඩමේ නම | පිඹුරු අංකය හා කට්ටි අංකය | පිහිටි ග්‍රාම නිළධාරී වසම | ඉඩමේ ප්‍රමාණය | දැනට ඉඩමේ භාවිතය | ඉඩමේ අයිතිය | ගත් ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|---|---|---|
| 1 | කුරුදුවත්ත | පිඹුරු අංකය 4012 කට්ටි අංකය 1,2,3 | මල්වත්තගම | අක්කර 02 පර්චස් 0.25 | **නව වෙළඳ සංකීර්ණය ඉදි කිරීම ඇතුලු වෙනත් සංවර්ධන කටයුතු, ප්‍රාදේශිය ලේකම් කාර්යාලය ඉදිරිපිට වාහන අංගනය , කුරුදුවත්ත පුස්තකාලය , කුරුදුවත්ත සතිපොල භූමිය හා පොදු වැසිකිලිය** | **ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව** | **ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂතුමා විසින් විකිණිමේ පදනම මත ඉඩම පවරා ගැනිම සඳහා ඉදිරිපත් කරන ලද තක්සේරු මුදල වන රු.9,993,990.00ක මුදල ඉදිරියේදී ගෙවිමට කටයුතු කරන බව දන්වා 2022.04.06 ලිපියක් මගින් දන්වා ඇත** |
| 2 | කුරුදුවත්ත | පිඹුරු අංකය 866 කට්ටි අංකය 1 | මල්වත්තගම | පර්චස් 36.65 | ප්‍රාදේශිය සභා නව ගොඩනැගිල්ල සහිත ඉඩම | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්තුමා විසින් 2020.01.17 දින යොමු කරන ලද මැනුම් නියෝගය අනුව මැනුම් කටයුතු සිදු කිරීම වෙනුවෙන් ගෙවිය යුතු මුදල වන රු.20,000.00ක මුදල ගෙවා ඇත |
| 3 | මැදගොඩ හන්දිය | පිඹුරු අංකය 4758 කට්ටි අංකය 1,3 | උඩහේන්තැන්න | අක්කර 01 රූඩ් 01 පර්චස් 33.8 | උඩහේන්තැන්න මැදගොඩ හන්දිය ඉඩම ( වෙළඳ සංකීර්ණය ඉදි කිරීම ) | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් ප්‍රාදේශිය සභාවට පවරා ගැනිම සඳහා මැනුම් ගාස්තු ගෙවිමට යටත්ව මැනුම් කිරීමට කටයුතු කර ඇත. |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 4 | මහවිලවත්ත | අණුරේඛණ අංක 2017/10 කට්ටි අංක 1 | උඩගම | අක්කර 02 රූඩ් 02 | කසල ප්‍රතිචක්‍රිකරණ මධ්‍යස්ථානය ඉදි කිරීම | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව | ඉඩම් අත්පත් කර ගැනිමේ යෝජනා ප්‍රධාන ලේකම් කාර්යාලයේ , ප්‍රධාන ලේකම්ගේ අනුමැතියෙන් 2022.06.21 වන දින පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යංශ ලේකම්ගේ අනුමැතියට යොමු කර ඇත. |
| 5 | මරියාවත්ත එස්ටේට්හි ඇත්ගාල ඩිවිෂන් | පිඹුරු අංක 3668 කට්ටි අංක 1,2 | ඇත්ගාල උතුර | රූඩ් 02 පර්චස් 21..6 | ඇත්ගාල වෙළඳ සංකීර්ණය හා වෙනත් සංවර්ධන කටයුතු | වි අලෙවි මණ්ඩලය | අදාල ඉඩම පවරා දෙන ලෙස වි අලෙවි මණ්ඩලයෙන් ඉල්ලීම් කර ඇත |
| 6 | ක්‍රේහෙඩ්වත්ත | | උඩහේන්තැන්න | අක්කර 0.5 | හල්දොල සේවා පියස පිහිටා ඇත | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් ප්‍රාදේශිය සභාවට පවරා ගැනිම සඳහා මැනුම් ගාස්තු ගෙවිමට යටත්ව මැනුම් කිරිමට කටයුතු කර ඇත. |

## ක්‍රිඩාපිටි - ප්‍රගතිය

| අනු අංකය | විස්තරය | ප්‍රගතිය | ඇමුණුම |
|---|---|---|---|
| 1 | ගඟ ඉහළ කොරළේ ප්‍රාදේශිය ලේකම්ගෙන් ප්‍රාදේශිය සභාව වෙත පවරා ගැනිමට කටයුතු කර ඇති ක්‍රිඩාපිටි | 1.ක්‍රිඩාපිටි 05 ක් ගඟ ඉහළ කොරළේ ප්‍රාදේශිය ලේකම්ගෙන් නෛතිකව පවරා ගැනිම සඳහා ප්‍රාදේශිය ලේකම් විසින් අවශ්‍ය බව දන්වා ඇති පළාත් පාලන කොමසාරිස්ගේ ඉල්ලීම් ලිපිය ප්‍රාදේශිය ලේකම් වෙත ලබා දිමට කටයුතු කර ඇත<br><br>2.ඇත්ගාල ක්‍රිඩාපිටිය ප්‍රාදේශිය සභාවට පවරා ගැනිම සඳහා පළාත් පාලන කොමසාරිස්ගේ එකඟතාවය සහිතව ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත ඉල්ලිම යොමු කර ඇත | ඇමුණුම-01 |
| 2 | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් ප්‍රාදේශිය සභාවට පවරා ගැනිම සඳහා මැනුම් ගාස්තු ගෙවිමට යටත්ව මැනුම් කිරිමට කටයුතු කර ඇති ක්‍රිඩා පිටි | ක්‍රිඩාපිටි 05 ක් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් ප්‍රාදේශිය සභාවට පවරා ගැනිම සඳහා මැනුම් ගාස්තු ගෙවිමට යටත්ව මැනුම් කිරිමට කටයුතු ඇත. | ඇමුණුම-02 |
| 3 | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් ප්‍රාදේශිය සභාව වෙත පවරා දෙන ලෙස ඉල්ලුම් කර ඇති ක්‍රිඩාපිටි | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ක්‍රිඩාපිටි 06 ක් ප්‍රාදේශිය සභාවට පවරා ගැනිම පවරා ගැනිම සඳහා දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩලයේ අධ්‍යක්‍ෂ වෙත ලිඛිතව ඉල්ලීම් කර ඇත. | ඇමුණුම-03 |

## ප්‍රජාශාලා

| අනු අංකය | ප්‍රජාශාලාව | වර්තමාන තත්වය |
|---|---|---|
| 1 | උලපනාවත්ත ප්‍රජාශාලා ඉඩම | ලියාපදිංචි ඔප්පු සකස් කිරිම සඳහා නිතිඥ මහතා වෙත යොමු කර ඇත |

| **අනු අංකය** | **ප්‍රජාශාලාව** | **ගම** | **වසම** | **ප්‍රගතිය** |
|---|---|---|---|---|

| | | | | |
|---|---|---|---|---|
| 1 | සුවඳගල ප්‍රජාශාලාව | සුවඳගල | ගැමුණුපුර | දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩලයේ අධ්‍යක්ෂ වෙත ක්‍රීඩාපිටිය පවරා ගැනිම සඳහා ඉල්ලීම් කර ඇත. |
| 2 | ගෝනවත්ත ප්‍රජාශාලාව | ගෝනවත්ත | ගැමුණුපුර | |
| 3 | ගැමුණුපුර ප්‍රජාශාලාව | ගැමුණුපුර | ගැමුණුපුර | |
| 4 | කොළුවල ප්‍රජාශාලාව | කොළුවල | පැල්ලැපිටිය දකුණ | |
| 5 | උඩගම ජාපාවත්ත ප්‍රජාශාලාව | උඩගම | උඩගම | |
| 6 | උඩගම කන්ද ප්‍රජාශාලාව | උඩගම | උඩගම | |

**ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් ප්‍රාදේශීය සභාවට පවරා ගැනිම සඳහා මැනුම් ගාස්තු ගෙවිමට යටත්ව මැනුම් කිරිමට කටයුතු කර ඇති ප්‍රජාශාලා-03**

| අනු අංකය | ප්‍රජාශාලාව | ඉඩමේ නම | ප්‍රමාණය | ප්‍රගතිය |
|---|---|---|---|---|
| 01 | ඇපලවත්ත ප්‍රජාශාලාව | ඇපලවත්ත | පර්චස් 30 (දළ වශයෙන්) | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් ප්‍රාදේශීය සභාවට පවරා ගැනිම සඳහා මැනුම් ගාස්තු ගෙවිමට යටත්ව මැනුම් කිරිමට කටයුතු කර ඇත. |
| 02 | අම්පිටිය ජන උදාන ප්‍රජාශාලාව | ක්‍රේහෙඩ් වත්ත | අක්කර 1/2 (දළ වශයෙන්) | |
| 03 | මල්ගොල්ල ප්‍රජාශාලාව | මල්ගොල්ල වත්ත | අක්කර 1/2 (දළ වශයෙන්) | |

## 04.මාර්ග

## 2017.12.08 අංක 2049 ගැසට් පත්‍රය යටතේ ගැසට් කර ඇති මාර්ග

| අනු අංකය | මාර්ගයේ නම | දිග (කි.මි/මි) | පළල (අඩි) |
|---|---|---|---|
| 01 | මාවතුපොල සැලව මාර්ගය | 621.5 m | 20 |
| 02 | කොලුවල සිට සමර්සෙට් මාර්ගය | 341 m | 10 |

2018 ගැසට් කර ඇති මාර්ග

| අනු අංකය | මාර්ගයේ නම | දිග (කි.මි/මි) | පළල (අඩි) |
|---|---|---|---|
| 01 | උඩුවැල්ල සිට ඇපලවත්ත හරහා අසුපිණි ඇල්ල පාර | 3.8 Km | 24 |

2021වර්ෂයේ ගැසට් කිරීමට මිනුම් කර ඇති මාර්ග

| අනු අංකය | මාර්ගයේ නම | දිග (කි.මි/මි) | පළල (අඩි) | පිඹුරුපත් අංකය |
|---|---|---|---|---|
| 01 | රජඇල අසල සිට ගම්පොලවෙල ප්‍රධාන පාරට සම්බන්ධ වන මහපුරණ පාර | 01Km | 12 | 3418 |
| 02 | ඇත්ගාල ප්‍රධාන පාර | 02km | 14 | 3417 |
| 03 | සිංහපුරගම මැද පාර | 750m | 10 | 3419 |
| 04 | වැටකේදෙණිය සිට උඩුවැල්ල දක්වා පාර | 3.5km | 10 | 3421 |
| 05 | යටපාන බුන්නාව හරහා තියඹරාමය දක්වා පාර | 750m | 10 | 3420 |
| 06 | පරගල බස්නැවතුම්පොල අසල සිට පරගල නව ජනපදය පාර | 2km | 10 | 3413 |
| 07 | කොලුවල වැලිහිරියේ සිට බටගොල්ල දක්වා පාර | 1.7km | 10 | 3416 |
| 08 | මීතලාව නාගහමුල හන්දියේ සිට ගිරාඋල්ල පන්සල හරහා ප්‍රධාන පාරට සම්බන්ධ වන අතුරු මාර්ගය | 1.5km | 10 | 3415 |
| 09 | අලුගොල්ලේ සිට රන්තැටියාවත්තට යන පාර | 1km | 10 | 3414 |

## 2022 වර්ෂයේ මිනුම් කර ගැසට් කිරීමට යෝජිත මාර්ග

| අනු අංකය | මාර්ගයේ නම | දළ දුර (කි.මි/මි) |
|---|---|---|
| 01 | ජයමාලපුර 10 වන පටුමග | 01Km |
| 02 | මුස්ලිම් විද්‍යාලය අසල සිට තලේගොඩ පිට්ටනිය හරහා පයනු වංගුව දක්වා පාර | 03km |

| | | |
|---|---|---|
| 03 | වැලිකන්ද සිට හැරකොළ දක්වා පාර | 03km |
| 04 | ගම්පොලවෙල ගනේවත්ත පාර | 1.5km |
| 05 | පරගල ගම මැද ක්‍රීඩාපිටිය අසල සිට ගම මැද මාර්ගය කුලරත්න මහතාගේ නිවස අසල දක්වා පාර | 01Km |
| 06 | ගල්පාය සිට ගම්පොල හරහා ලෙව්වම්වත්ත පාර | 4km |
| 07 | බොස්වෝඩි පන්සල අසල සිට රහලගල දක්වා දිවෙන පාර | 2km |
| 08 | මීතලාව සිට උඩගම බෝමළුව දක්වා පාර | 1.5Km |

05.යථා පරිදි කල්දී ඇති යෝජනා - ඇත

05:01 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා

05:01:01: I 2023 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම යෝජනාව සභාගත කරන ලදි.

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 146 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරි ඇති බලතල ප්‍රකාර ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ ඇතුළත පිහිටි දියුණු කළප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කරන ලද උලපනේ, දොලොස්බාගේ, රාක්ෂාව යන ප්‍රදේශවල පිහිටි සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ගෙපත්වල 2022 වර්ෂයේ වාර්ෂික වටිනාකම් 2023 වර්ෂය සඳහා පිළිගැනීමටත්, එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර ඉහත කී වාර්ෂික වටිනාකමින් සියයට හය (6%) ක වරිපනමක් 2023 වර්ෂය සඳහා පනවා අය කිරිමටත්, සහ:ඒ වරිපනම්, එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (6)වන උප වගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30,දෙසැම්බර් 31 යන දින වලින් අවසන් වන කාර්තු හතර තුළදී සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කිරීමටත් ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ජී. සරත් කුමාර ලාල් මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

පවතින ආර්ථික තත්ත්වය අනුව වාර්ෂිකව අය කරනු ලබන වරිපනම් බදු මෙවරත් වැඩි නොකර අය කිරීමට අපි තීරණය කළා. එම නිසා වරිපනම් ගාස්තු වැඩි නොකර දැනට පවතින මිළම අයකිරීම සුදුසු බවට ගරු මහා සභාවට මම යෝජනා කරනවා. මේ පිළිබඳව ගරු මහා සභාවේ අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එන්.එම්. නන්දාවතී මහත්මිය

ගරු සභාපතිතුමනි, දොළොස්බාගේ ප්‍රදේශය දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් මෙහි සඳහන් කර තිබෙන නමුත් දොළොස්බාගේ ප්‍රදේශය දියුණු කළ ප්‍රදේශයක්ද දියුණු වෙමින් පවතින ප්‍රදේශයක්ද දියුණු කිරීමට බලාපොරොත්තුවන ප්‍රදේශයක්ද යන්න පිළිබඳ මට සැකයක් මතුවෙනවා. වරිපනම් අය කරන ප්‍රදේශයක අවම වශයෙන් පානීය ජලය හෝ තිබිය යුතුයි. නගරයට වසර පහක පටන් පානීය ජල පහසුකම් නැහැ. කාණු පද්ධතිය අවහිර වීම නිසා වැසි සමයේදී මදුරු ගහනය වැඩි වෙනවා. සුසාන භූමියේ වල් බිහිවී තිබෙන බැවින් ලෙව්දෙණිය, හපනාමැරූ ගොවි ජනපදයේ ජනතාවට භූමදානය කිරීමට ස්ථානයක් නැහැ. පූජ්‍ය පට්ටිපොල සුමනරතන හිමියන් විසින් නගරයට පොදු වැසිකිළියක් පිළිසකර කර දුන් නමුත් පසුගිය වැසි සමයේදී එය කඩාවැටී තිබෙනවා. මෙම මූලික අවශ්‍යතා හැකි

පමණ ඉටුකර 2023 වර්ෂයේදී වරිපණම් බදු එකතු කිරීමට කටයුතු කරන මෙන් මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමා

ගරු මන්ත්‍රීතුමිය, හිටපු කෘෂිකර්ම අමාත්‍ය ගරු මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා දොලොස්බාගේ නගරය ඉදි කිරීම සඳහා විශාල උත්සාහයක් දැරූ නමුත් ඉඩම් ප්‍රශ්නයක් ඇතිවූ නිසා එය සිදුකිරීමට හැකියාව ලැබුණේ නැහැ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ඩබ්.නාලක වසන්ත අබේසේකර මහතා

ගරු සභාපතිතුමනි, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එන්.එම්. නන්දාවතී මහත්මිය දොලොස්බාගේ ප්‍රදේශය දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් නම් කිරීම සම්බන්ධව යම් යම් කරුණු සඳහන් කළත්, වරිපනම් පනවන කාලවකවානුවේ දී දොලොස්බාගේ යනු මෙම ප්‍රදේශයේ ප්‍රධාන රෝහල, දුරකථන පහසුකම් ආදී සියල්ල පැවති විශාල දියුණු නගරයක්. ඇත්ත වශයෙන්ම වරිපනම් අය කරන්නේ නම් මූලික අවශ්‍යතා සම්පූර්ණ කර පහසුකම් සපයා තිබිය යුතුය යන්න මාගේද අදහසයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය පට්ටිපොල සුමනරතන හිමි

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එන්.එම්. නන්දාවතී මහත්මිය දැක්වූ කරුණුවලට අමතරව මම තවත් අදහස් කිහිපයක් ඉදිරිපත් කළයුතුයි. ප්‍රජා ජල ව්‍යාපෘතිය මගින් දිනකට දෙවරක් ජලය බෙදාහැරීම සිදුකෙරෙනවා. වසර ගණනාවක් පැවති ප්‍රාදේශීය සභා ජල ව්‍යාපෘතිය අයිස්පිහිල්ල ප්‍රදේශය ආසන්නයේ නතර වී තිබෙනවා. දැනට ජලය ලබාගන්නේ නිවාස දෙකක් හෝ තුනක් පමණයි. ප්‍රජා ජල සමිතිය සමග සාකච්ඡා කර ඉතිරිව ඇති බට යම් ප්‍රමාණයක් හෝ යොදාගනිමින් එම ව්‍යාපෘතිය නිම කර දෙන ලෙස ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා. ගරු සභාපතිතුමනි, සමිතිය කැඳවා මේ සම්බන්ධයෙන් සාකච්ඡා කර තීරණයක් ගෙන ඔබතුමා දැනුවත් කරන්නම්. අනෙක් කරුණ නම් ගලමුදුන ජනපද සුසාන භූමිය, අට්ටමල් ජනපද සුසාන භූමිය, ලෙව්දෙණිය සුසාන භූමිය යන සුසාන භූමිවල වල් බිහිවී තිබෙන බැවින් බැකෝ යන්ත්‍රය යොදවා ශුද්ධ කර දෙන ලෙසත් ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමා

ගරු ස්වාමින්වහන්ස, ජල ව්‍යාපෘතිය සඳහා බට ලබා ගැනීම පිළිබඳව සාකච්ඡා කර තීරණයකට එළැඹෙමු. මේ සම්බන්ධව වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව හා විරුද්ධත්වයක් නොමැති බව පෙනීයනවා.

තීරණය

ඒ අනුව 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 146 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ ඇතුළත පිහිටි දියුණු කළ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කරන ලද උලපනේ, දොලොස්බාගේ, රාක්ෂාව යන ප්‍රදේශවල පිහිටි සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ගෙපත්වල 2022 වර්ෂයේ වාර්ෂික වටිනාකම් 2023 වර්ෂය සඳහා පිළිගැනීමටත්, එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර ඉහත කී වාර්ෂික වටිනාකමින් සියයට හය (6%) ක වරිපනමක් 2023 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, සහ: ඒ වරිපනම්, එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (6)වන උප වගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30,දෙසැම්බර් 31 යන දින වලින් අවසන් වන කාර්තු හතර තුළදී සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කිරීමටත් සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

05:01:01:II 2023 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම යෝජනාව සභාගත කරන ලදි.

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1)වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2022 වර්ෂයේදී බලාත්මක කරන ලද සත්‍යෙක්ෂණය කිරීම 2023 වර්ෂය සඳහා පිළිගැනීමටත්, එකී පනතේ 134 වන වගන්තියේ (3)වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියාවූ ද ඉහත කී පනතේ 135 වන වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තාවූ ද ,ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේවූ -

(අ) හෙක්ටෙයාර් පහක් හෝ ඊට වැඩිවූ සෑම ඉඩමක් වෙනුවෙන් ම, එකී ඉඩමේ සෑම හෙක්ටයාරයක් ම මත 2023 වර්ෂය සඳහා රුපියල් දහය බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමටත්,

(ආ) ඉහත කී පනතේ 134 වන වගන්තියේ (3) වන උප වගන්තියේ අතුරු විධානය යටතේ පළාත් පාලන විෂයභාර ගරු අමාත්‍යතුමා විසින්, ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය විශේෂ ප්‍රදේශයක් වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ IV (ආ) වන කොටසේ 1989.02.03 දිනැති අංක 544 දරණ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කර ඇති හෙයින්, හෙක්ටයාර් එකකට වැඩි එහෙත් හෙක්ටයාර් පහකට අඩුවූ සෑම ඉඩමක් මත ,2023 වර්ෂය සඳහා රුපියල් 50.00 බැගින් වන වාර්ෂික අක්කර බද්දක් පනවා අය කිරීමට, සහ

(ඇ) ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (6) වන උප වගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දින වලට පෙර සමාන වාරික හතරකින් ගෙවීමට විධාන කළ යුතු යයි ද ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශිය සභාව යෝජනා කරන්නීය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.පී. කොල්වින් සිල්වා මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1)වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2022 වර්ෂයේදී බලාත්මක කරන ලද සත්‍යෙක්ෂණය කිරීම 2023 වර්ෂය සඳහා පිළිගැනීමටත්, එකී පනතේ 134 වන වගන්තියේ (3)වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියාවූ ද ඉහත කී පනතේ 135 වන වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තාවූ ද ,ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේවූ ඉඩම් සඳහා
2023 වර්ෂයට අදාළව අක්කර බදු අය කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා. මේ පිළිබඳව වෙනත් අදහස් ඇත්නම් ඉදිරිපත් කරන ලෙසත් එසේ නොමැතිනම් එම යෝජනාව සභා සම්මත කර ගන්නා ලෙසත් මා ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමා

කිසිත් අදහසක් ඉදිරිපත් නොවන බව හා විරුද්ධත්වයක් නොමැති බව පෙනීයනවා.

තීරණය

ඒ අනුව 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ (1)වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2022 වර්ෂයේදී බලාත්මක කරන ලද සත්‍යෙක්ෂණය කිරීම 2023 වර්ෂය සඳහා පිළිගැනීමටත්, එකී පනතේ 134 වන වගන්තියේ (3)වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියාවූ ද ඉහත කී පනතේ 135 වන වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තාවූ ද ,ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේවූ ඉඩම් සඳහා

2023 වර්ෂයට අදාළව අක්කර බදු අය කිරීම සුදුසු බවට තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05:01:01:III 2023 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම යෝජනාව සභාගත කරන ලදි.**

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 150 වැනි වගන්තියේ (1)වන උප වගන්තියෙන් ප්‍රාදේශිය සභා වලට ලැබී ඇති බලතල ප්‍රකාර,ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උප ලේඛනයේ 1 වැනි තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන් එම උප ලේඛනයේ II වන තීරුවේ,ඒ එක් එක් කර්මාන්තය පවත්වා ගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2023 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බවටත්, එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු 2023 වර්ෂයේ අප්‍රේල් මස 30 වන දිනට පෙර ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උප ලේඛනය

| අනු අංකය | 1 වැනි තීරුව කර්මාන්තය | 11 වැනි තීරුව ස්ථානයේ වාර්ෂික වටිනාකම රු.750 නොඉක්මවන අවස්ථාවක | රු.750 ඉක්මවන එහෙත් රු.1500 නොඉක්මවන අවස්ථාවක | රු.1500 ඉක්මවන අවස්ථාවක |
|---|---|---|---|---|
| 01. | ශබ්ද විකාශන යන්ත්‍රයක් කුලියට දීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 02. | රෙදිපිළි සාප්පුවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 03. | යකඩ බඩු වෙළඳසැලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 04. | ඉංග්‍රීසි බෙහෙත් බඩු අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 05. | ආයුර්වේද බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 06. | ඩිස්පෙන්සරියක් (අපරදිග)පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 07. | ගුවන් විදුලි/රූපවාහිනි/කැසට්/පරිගණක/පා පැදි යතුරුපැදි/මහන මැෂින් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 08 | අපනයන ද්‍රව්‍ය එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 09. | රෙදි හම්වලින් බෑග් /භාණ්ඩ නිපදවන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 10. | සාප්පු බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 50.00 | 1000.00 |
| 11. | පාවහන් /බෑග් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 12. | කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 13. | පොත් පත් /ලිපි ද්‍රව්‍ය අලෙවිසැලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 14. | පුවත්පත් බෙදාහැරීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 15. | වීඩියෝ චිත්‍රපට පෙන්වන හා වීඩියෝ කැසට්පට පෙන්වන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 16. | නිමි ඇඳුම් නිපදවන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 17. | විසිතුරු මසුන් ඇති කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 18. | දේශීය හා විදේශීය දුරකථන ඇමතුම් ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 19. | ඇදුම් මසන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 20. | හඳුන්කූරු නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 21. | විදුලි උපකරණ අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 22. | වැලි ගොඩ දැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 23. | බිම්මල් වගා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 24. | විදේශ රැකියා ඒජන්සියක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 25. | අත්කම් භාණ්ඩ නිෂ්පාදනය හා අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| 26. | තරාදි අලෙවිසැලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 27. | මහන මැෂින් අලුත්වැඩියාකිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 28. | ඇස් කණ්ණාඩි අලෙවිසැලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 29. | කාය වර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 30. | අභ්‍යාස පොත් නිෂ්පාදනය හා අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| 31. | ජ්‍යොතිෂ්‍ය සේවා ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 32. | කොට්ට,ඇඳ ඇතිරිලි,පාපිසි අලෙවි කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 33. | මංගල පෝරු කුලියට දීමේ මධ්‍යස්ථානයක් පැවැත්වීම | 500.00 | 750.00 | 1000.00 |
| 34. | අභ්‍යාස පොත් හා ලියුම් කවර නිෂ්පාදනය හා අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| 35. | සැලසුම් ශිල්පියෙකු ලෙස කටයුතු කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 36. | ආයුර්වේද බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 37. | අන්තර්ජාල සේවා සැපයීම | 500.00 | 750.00 | 1000.00 |
| 38. | CCTV කැමරා සවි කරන ආයතනයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 39. | පරිගණක ආශ්‍රිත මෝස්තර නිර්මාණය | 500.00 | 750.00 | 1000.00 |
| 40. | දර අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| 41. | වළං වෙළඳසැලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 42. | මල්,විසිතුරුපැල,බෝග පැල තවානක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 43. | පිත්තල භාණ්ඩ අලෙවි සැලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 44. | තහඩුවලින් මිනුම් උපකරණ නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 45. | ලී කුඩුවලින් ජීව ඉන්ධන නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 46. | රබර් පාවහන් නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 47. | පොල් ලෙලි ආශ්‍රිත නිෂ්පාදන | 500.00 | 750.00 | 1000.00 |
| 48. | තිනර් නිෂ්පාදන කර්මාන්ත නිෂ්පාදන | 500.00 | 750.00 | 1000.00 |
| 49. | ලිහිසි තෙල් අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| 50. | සිල්ලර කඩයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 51. | රෙදිපිළි වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 52. | රෙදි මැසීමේ කර්මාන්ත ශාලා පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 53. | තේ කර්මාන්ත ශාලා පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 54. | සපත්තු සෑදීමේ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 55. | ගිනි පෙට්ටි කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 56. | පානීය ජල නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාර | 500.00 | 750.00 | 1000.00 |
| 57. | ටයර් ටියුබ් නැවත පිරවීම | 500.00 | 750.00 | 1000.00 |
| 58. | වී මෝලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 59. | ධාන්‍ය වර්ග කුළුබඩු ඇඹරුම්හලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 60. | වඩු මඩුවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 61. | ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 62. | ටයර් ගබඩා කිරීම හෝ විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 63. | ඉටිපන්දම් නිෂ්පාදනය හා අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| 64. | ක්ෂණික ඡායාරූප පිටපත්කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 65. | ලොතරැයි කුඩුවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 66. | ව්‍යාපාරික කාර්යයන් සඳහා භාණ්ඩ ගබඩා කර තබා ගැනීම | 500.00 | 750.00 | 1000.00 |

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය පට්ටිපොල සුමනරතන හිමි

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 150 වැනි වගන්තියේ (1)වන උප වගන්තියෙන් ප්‍රාදේශිය සභා වලට ලැබී ඇති බලතල ප්‍රකාර,ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන ඉහත උප ලේඛනයේ 1 වැනි තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන් එම උප ලේඛනයේ II වන තීරුවේ, ඒ එක් එක් කර්මාන්තය පවත්වා ගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2023 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බවටත්, එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු 2023 වර්ෂයේ අප්‍රේල් මස 30 වන දිනට පෙර ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් ගරු මහා සභාවට යෝජනා කරනවා. මේ පිළිබඳව වෙනත් අදහස් ඇත්නම් ඉදිරිපත් කරන ලෙසත් එසේ නොමැතිනම් එම යෝජනාව සභා සම්මත කර ගන්නා ලෙසත් මා ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමා

කිසිත් අදහසක් ඉදිරිපත් නොවනබව හා විරුද්ධත්වයක් නොමැතිබව පෙනීයනවා.

ඒ අනුව 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 150 වැනි වගන්තියේ (1)වන උප වගන්තියෙන් ප්‍රාදේශිය සභා වලට ලැබී ඇති බලතල ප්‍රකාර,ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන ඉහත උප ලේඛනයේ 1 වැනි තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන් එම උප ලේඛනයේ II වන තීරුවේ,ඒ එක් එක් කර්මාන්තය පවත්වා ගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2023 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බවටත්, එකී කර්මාන්ත බද්දටයටත් තැනැත්තෙකු 2023 වර්ෂයේ අප්‍රේල් මස 30 වන දිනට පෙර ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05:01:01: IV 2023 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම යෝජනාව සභාගත කරන ලදි.

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 152 වැනි වගන්තියේ (1)වන උප වගන්තියෙන් ප්‍රාදේශිය සභා වලට ලැබී ඇති බලතල ප්‍රකාර, එකි පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බල පත්‍රයක් ලබා ගැනිම හෝ එක් පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නාවූ හා වෘත්තියක් නොවන්නාවූ කිසියම් ව්‍යාපාරයක් ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය ඇතුළත 2022 වර්ෂයේදී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන් ම, එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උප ලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සිමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II වන තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2023 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, බද්දට යටත් සෑම තැනැත්තෙකු එකි ව්‍යාපාර බද්ද 2023 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නිය.

01. කොමිස් ඒජන්තවරු

02. වෙළෙන්දේසිකරුවන්

03. බ්‍රෝකර්වරුන්
04. මුදල් ණයට දෙන්නන්
05. උකස් බඩු ගන්නන්
06. කොන්ත්‍රාත්කරුවන් -සිවිල් - ඉදිකිරීම්
07. සැපයුම්කරුවන්
08. රියදුරු පුහුණු ආයතන
09. ලොතරැයි අලෙවි නියෝජිතයින්
10. රක්ෂණ නියෝජිතයින්
11. මෝටර් රථ වාහන වෙළදාම් කරන්නන්
12. ගණන් පරීක්ෂකවරුන්
13. පෞද්ගලික අධ්‍යාපන පන්ති පවත්වන්නන්
14. ගණකාධිකාරීවරුන්
15. රැකියා ඒජන්සිකරුවන්
16. වෛද්‍යවරුන්
17. නොතාරිස්වරුන්
18. ඇඟලුම් කර්මාන්ත ශාලා පවත්වන්නන්
19. මිනින්දෝරුවරුන්
20. සැර බීම ස්ථාන පවත්වාගෙන යන්නන්
21. ආරක්ෂක සේවා සැපයීම
22. ආනයන සහ අපනයනකරුවන්
23. උත්සව ශාලා පවත්වාගෙන යන්නන්
24. පෙර පාසලක් පවත්වාගෙන යාම
25. ජාත්‍යන්තර පාසල් පවත්වාගෙන යාම
26. නීතිඥවරු
27. සමාගමක උප ඒජන්සි මාර්ගයෙන් භාණ්ඩ අලෙවි කරන්නන්
28. පෞද්ගලික රෝහලක් පවත්වාගෙන යාම
29. පිරිසිදු කිරීමේ සමාගමක් පවත්වාගෙන යන්නවුන්
30. තුරඟ තරඟ ඔට්ටු භාරගැනීමේ ස්ථාන
31. මිනී පෙට්ටි නිපදවීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
32. කෘතිම ඇස් පිහාටු සකස් කිරීම - කොණ්ඩා මෝස්තර සැකසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
33. පූජා භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
34. වැලි හා ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවිය
35. පාවිච්චි කරන ලද වාහන අමතර කොටස් විකිණීම
36. නිවාස සැලැසුම් හා ඇස්තමේන්තු සකස් කිරීම
37. යතුරු පැදි අලෙවිය
38. පස් කැපීමේ යන්ත්‍ර කුලියට දීමේ ස්ථාන
39. උත්සව භාණ්ඩ කුලියට දීමේ ස්ථාන
40. ප්‍රවාහන සේවා සැපයීමේ ස්ථාන
41. වාහනවලින් පැමිණ වෙළදාම් කරන්නන්

42. කුඩා කර්මාන්ත ශාලා
43. සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන
44. බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම
45. ඉන්ධන පිරවුම්හලක් පවත්වාගෙන යාම
46. විදේශ සේවා සමාගමක් පවත්වාගෙන යාම
47. පෞද්ගලික සාත්තු නිවාස පවත්වාගෙන යාම
48. ස්වර්ණාභරණ වෙළදසැලක් පවත්වාගෙන යාම
49. ටයර් නැවත පිරිවීමේ,විකිණීමේ හා ගබඩා කිරීමේ ස්ථාන පවත්වාගෙන යාම
50. මෝටර් රථ අමතර කොටස් ගබඩා කරන ස්ථානයක් පවත්වාගෙන යාම
51. අමු තේ දළු එකතු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
52. පරිගණක මුද්‍රණ,ස්ක්‍රීන් මුද්‍රණය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
53. අන්තර්ජාල සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම
54. ආනයනය කරන ලද වාහන කොටස් අලෙවි කිරීම
55. නාන කාමර කට්ටල අලෙවිය
56. විදේශ චාරිකා සංවිධානය කිරීම

උපලේඛනය

| 1 වැනි තීරුව | 11 වැනි තීරුව |
|---|---|
| බද්ද අදාළ වන වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය | ගෙවිය යුතු බද්ද රු. ශත |
| 1. රු.6000 නොඉක්මවන අවස්ථාවක | නැත |
| 2. රු.6,000 ඉක්මවන එහෙත් රු.12,000 නොඉක්මවන අවස්ථාවක | 90.00 |
| 3.රු.12,000 ඉක්මවන එහෙත් රු.18,750 නොඉක්මවන අවස්ථාවක | 180.00 |
| 5.රු.18,750 ඉක්මවන එහෙත් රු.75,000 නොඉක්මවන අවස්ථාවක | 360.00 |
| 6.රු.75,000 ඉක්මවන එහෙත් රු.150,000 නොඉක්මවන අවස්ථාවක | 1200.00 |
| 7.රු.1,50,000 ඉක්මවන අවස්ථාවක | 3000.00 |

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.පී.ඩබ්.පී.පී. ගුරුගේ මහතා</u>

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

<u>ගරු සභාපතිතුමා</u>

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 150 වැනි වගන්තියේ (1)වන උප වගන්තියෙන් ප්‍රාදේශිය සභා වලට ලැබී ඇති බලතල ප්‍රකාර,ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන ඉහත උප ලේඛනයේ 1 වැනි තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන් එම උප ලේඛනයේ II වන තීරුවේ,ඒ එක් එක් කර්මාන්තය පවත්වා ගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2023 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බවටත්, එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු

2023 වර්ෂයේ අප්‍රේල් මස 30 වන දිනට පෙර ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් ගරු මහා සභාවට යෝජනා කරනවා. මේ පිළිබඳව වෙනත් අදහස් ඇත්නම් ඉදිරිපත් කරන ලෙසත් එසේ නොමැතිනම් එම යෝජනාව සභා සම්මත කර ගන්නා ලෙසත් මා ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමා

මේ පිළිබඳව වෙනත් අදහස් ඉදිරිපත් නොවන බව පෙනී යනවා.

තීරණය

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 152 වැනි වගන්තියේ (1)වන උප වගන්තියෙන් ප්‍රාදේශිය සභා වලට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බල පත්‍රයක් ලබා ගැනිම හෝ එක් පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නාවූ හා වෘත්තියක් නොවන්නාවූ කිසියම් ව්‍යාපාරයක් ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය ඇතුළත 2022 වර්ෂයේදී කරගෙන

යනු ලබන සෑම තැනැත්තෙකුගෙන් ම, එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උප ලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සිමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II වන තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2023 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, බද්දට යටත් සෑම තැනැත්තෙකු එකී ව්‍යාපාර බද්ද 2023 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05:01:01:V කිසියම් කර්මාන්තයක් පවත්වා ගෙන යාමට අදාළ අතුරු ව්‍යවස්ථා යටතේ 2023 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීම යෝජනාව සභාගත කරන ලදි.

ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති අතුරු ව්‍යවස්ථාවක් යටතේ ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් 2023 වර්ෂය තුළදී නිකුත් කරන ලද බලපත්‍ර සම්බන්ධයෙන්, 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමඟ කියවිය යුතු 149 වන වගන්තියෙන් ප්‍රාදේශිය සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාර පහත උප ලේඛනයේ I වන තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන්, එම උප ලේඛනයේ II වන තීරුවේ අනුරූපසටහනෙහි නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමටත්,
එකී උප ලේඛනයේ සඳහන් කර්මාන්තය ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කරඇති හෝ එය විසින් අනුමත කර ඇති හෝ පිළිගෙන ඇත හෝටලයක් හෝ ආපන ශාලාවක් හෝ නවාතැන් පොළක් වනවිට, එකී හෝටලයෙන් හෝ ආපන ශාලාවෙන් හෝ නවාතැන් පොළෙන් පසුගිය වර්ෂයේ ලත් ලැබීම් වලින් සියයට එක (1%)ක ප්‍රමාණය බලපත්‍ර ගාස්තු විය යුතුය. හෝටලය හෝ ආපන ශාලාව හෝ නවාතැන් පොළ ක්‍රියාත්මක වන පළමු අවුරුද්ද වන අවස්ථාවක II වන තීරුවේ නිරූපිත ප්‍රමාණය බලපත්‍ර ගාස්තුව වියයුතු බවට ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය .

උප ලේඛනය

| අනු අංකය | 1වැනි තීරුව | 11 වැනි තීරුව | | |
|---|---|---|---|---|
| | කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය | ස්ථානයේ වාර්ෂික වටිනාකම | | |
| | | රු.750.00 නොඉක්මවන අවස්ථාවක | රු.750.00 ට වැඩි එහෙත් 1500 ට නොඉක්මවන අවස්ථාවක | රු.15000 ඉක්මවන අවස්ථාවක |
| 01. | තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 02. | එළවළු හෝ පළතුරු කඩයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 03. | බේකරියක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 04. | බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 05. | බත් කඩයක්/ආපනශාලාවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 06. | රෙස්ටුරන්ට් එකක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 07 | කිරි පට්ටියක් පවත්වාගෙන යාම | | | |
| | එළදෙනුන් 05 ට වැඩි 10 ට අඩු | 500.00 | 750.00 | 1000.00 |
| | එළදෙනුන් 02 ට වැඩි 05 ට අඩු | 500.00 | 750.00 | 1000.00 |
| | එළදෙනුන් 10 ට වැඩි 25 ට අඩු | 500.00 | 750.00 | 1000.00 |
| | එළදෙනුන් 25 ට වැඩි | 500.00 | 750.00 | 1000.00 |
| 08. | ගෝ ඝාතක ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 09. | අනුමත සත්ත්ව මස් වෙළඳසැලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 10. | කඩල,රසකැවිලි නිෂ්පාදන ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 11. | ග්‍රොසරියක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 12. | සංචාරක වෙළදාම් කිරීම(අනුමත කරන ලද) | 500.00 | 750.00 | 1000.00 |
| 13. | මනාල/මනාලියන් හැඩගැන්වීම/ඇන්දවීම/කුලියට | | | |
| | දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 14. | තේ කොල/මිරිස්/තුනපහ කුඩු පැකට් කිරීමේ හා | | | |
| | අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 15. | බේකරි නිෂ්පාදන අලෙවි කිරීමේ ස්ථානයක් | | | |
| | පවත්වාගෙන යාම සදහා | 500.00 | 750.00 | 1000.00 |
| 16. | කිරි ආශ්‍රිත නිෂ්පාදන | 500.00 | 750.00 | 1000.00 |
| 17. | කිරි ආශ්‍රිත නිෂ්පාදන අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| 18. | ලී බඩු සාප්පුවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 19. | ගෘහ භාණ්ඩ අලෙවිසැලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 20. | කුළුබඩු පැකට් කිරීම හා අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| 21. | ලැගුම්හලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 22. | දැව ආශ්‍රිත ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |

<u>අන්තරාදායක ව්‍යාපාර</u>

| | | | | |
|---|---|---|---|---|
| 01. | කම්හලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 02. | යන්ත්‍රානුසාරයෙන් වඩුමඩුවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 03. | දර මඩුවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 04. | කුකුල් ගොවිපලක කුකුලන් 50 සිට 1000 දක්වා | 500.00 | 750.00 | 1000.00 |
| | කුකුලන් 1000 ට වැඩි නම් එක් සතෙකුගෙන් රු.5 බැගින් | 500.00 | 750.00 | 1000.00 |
| | එළුවන් 5 කට වැඩි ගොවිපලක එළුවන් 5ක් සහ ඊට වැඩි | 500.00 | 750.00 | 1000.00 |
| | ඌරන් 1 කට වැඩි ගොවිපලක් සඳහා | 500.00 | 750.00 | 1000.00 |
| 05. | ගරාජයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 06. | වින්කලයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 07. | ගඩොල් පෝරණුවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 08 | යෝගට් අයිස්ක්‍රීම් නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 09. | ලොන්ඩරියක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 10. | අනුමත කරන ලද මස් හෝ මාළු ශීතකරණවල | | | |
| | බහා අලෙවි කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 11. | වැලි/ බොරළු/කළුගල් ගබඩා කිරීමේ | | | |
| | ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 12. | පොල් තෙල් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 13. | වාහන සර්විස් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 14. | මාළු වෙළඳසැලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 15. | යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම | 500.00 | 750.00 | 1000.00 |
| 16. | දැව ගබඩා කර තැබීම | 500.00 | 750.00 | 1000.00 |
| 18. | පරණ ලෝහ,අළුත් ලෝහ ගබඩා කර තැබීම | 500.00 | 750.00 | 1000.00 |
| 19. | වායු සමන යන්ත්‍ර/ශීතකරණ/අධිශීතකරණ නිපදවීම/සර්විස් කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 20. | උළු ගඩොල් ගබඩා කර තැබීම | 500.00 | 750.00 | 1000.00 |
| 21. | ත්‍රී රෝද රථ අළුත්වැඩියාව | 500.00 | 750.00 | 1000.00 |
| 22. | මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 23. | රෙදි වියන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 24. | අත් යන්ත්‍ර මගින් රෙදි වියන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 25. | රෙදි/හම්වලින් බෑග්/භාණ්ඩ නිපදවන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 26. | පින්තූර රාමු කිරීම/බෝඩ් ඇදීම/පින්තාරු කිරීම කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 27. | සබන් සුවඳ විලවුන් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 28. | සිමෙන්ති ගබඩා කිරීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |

<u>පීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාර</u>

| | | | | |
|---|---|---|---|---|
| 01. | හුණු පෝරණුවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 02. | බැටරි චාජ් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 03. | භූමි තෙල්/පෙට්‍රෝල්/ඩීසල්/ගබඩා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 04. | ගුවන් විදුලි/රූපවාහිනි/පරිගණක යන්ත්‍ර අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 05. | යන්ත්‍රානුසාරයෙන් ලෝහ උණු කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 06. | කෘතිම පොහොර/කෘමිනාශක/බෙහෙත් වර්ග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 07. | වෑල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 08 | ගල් වලවල් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 09. | ගල් ඇඹරුම්හලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 10. | ඔරලෝසු/ජංගම දුරකථන/විදුලි උපකරණ අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 11. | ඇලුමිනියම්/ බෙලෙක් භාණ්ඩ නිපදවීම හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 12. | රන්, රිදී බඩු වර්ග වර්ණ ආලේප කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 13. | ගෑස් වර්ග ගබඩා කර තැබීම | 500.00 | 750.00 | 1000.00 |
| 14. | පොහොර ගබඩාවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 15. | රසායනික ද්‍රව්‍ය නිපදවීම/ ගබඩා කර තබා ගැනීම | 500.00 | 750.00 | 1000.00 |
| 16. | විෂබීජනාශක ද්‍රව්‍ය නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 17. | ලී දඬු ආරක්ෂක ද්‍රව්‍ය නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්. උදය කුමාර බණ්ඩාර මහතා</u>

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

ඉහතින් දක්වා ඇති කිසියම් කර්මාන්තයක් පවත්වා ගෙන යාමට අදාළ අතුරු ව්‍යවස්ථා යටතේ 2023 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා. මේ පිළිබඳව වෙනත් අදහස් ඇත්නම් ඉදිරිපත් කරන ලෙසත් එසේ නොමැති නම් එම යෝජනාව සභා සම්මත කර ගන්නා ලෙසත් මා ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමා

කිසිත් අදහසක් ඉදිරිපත් නොවන බව හා විරුද්ධත්වයක් නොමැති බව පෙනීයනවා.

තීරණය

ඒ අනුව ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති අතුරු ව්‍යවස්ථාවක් යටතේ ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂය තුළදී නිකුත් කරන ලද බලපත්‍ර සම්බන්ධයෙන්, 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමඟ කියවිය යුතු 149 වන වගන්තියෙන් ප්‍රාදේශිය සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාර පහත උප ලේඛනයේ I වන තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන්, එම උප ලේඛනයේ II වන තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමටත්, එකී උප ලේඛනයේ සඳහන් කර්මාන්තය ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කරඇති හෝ එය විසින් අනුමත කර ඇති හෝ පිළිගෙන ඇති හෝටලයක් හෝ ආපන ශාලාවක් හෝ නවාතැන් පොළක් වනවිට, එකී හෝටලයෙන් හෝ ආපන ශාලාවෙන් හෝ නවාතැන් පොළෙන් පසුගිය වර්ෂයේ ලත් ලැබීම් වලින් සියයට එක (1%)ක ප්‍රමාණය බලපත්‍ර ගාස්තු විය යුතුය. හෝටලය හෝ ආපන ශාලාව හෝ නවාතැන් පොළ ක්‍රියාත්මක වන පළමු අවුරුද්ද වන අවස්ථාවක II වන තීරුවේ නිරූපිත ප්‍රමාණය බලපත්‍ර ගාස්තුව වියයුතු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 05:01:01:VI 2023 වර්ෂය සඳහා ඉඩම් විකිණීම මත බදු පැනවීම යෝජනාව සභාගත කරන ලදි.

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 154 (1) වැනි උප වගන්තියෙන් ප්‍රාදේශීය සභා වලට ලැබී ඇති බලතල ප්‍රකාර,ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත පිහිටියාවූ යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු , ඔහුගේ සේවකයකු හෝ අනු නියෝජිතයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍ය ආකාරයකින් විකුණනු ලබන අවස්ථාවක ඒ ඉඩම් විකිණීමෙන් ලද මුදලෙන් සියයට එක (1%)ක සමාන බද්දක් 2023 වර්ෂයට පනවා අය කිරිමටත්, එකී බදු මුදල විකුණුම්කරු විසින් හෝ වෙන්දේසිකරු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයා හෝ අනු නියෝජිතයා විසින් එම ඉඩම් විකිණිමෙන් ලත් මුදලින් ගෙවිය යුතු බවට ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි චන්ද්‍රා අලුත්ගමගේ මහත්මිය

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 154 (1) වැනි උප වගන්තියෙන් ප්‍රාදේශීය සභා වලට ලැබී ඇති බලතල ප්‍රකාර,ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත පිහිටියාවූ යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු, ඔහුගේ සේවකයකු හෝ අනු නියෝජිතයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍ය ආකාරයකින් විකුණනු ලබන අවස්ථාවක ඒ ඉඩම් විකිණීමෙන් ලද මුදලෙන් සියයට එක (1%)ක සමාන බද්දක් 2023 වර්ෂයට පනවා අය කිරිමටත්, එකී බදු මුදල විකුණුම්කරු විසින් හෝ වෙන්දේසිකරු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයා හෝ අනු නියෝජිතයා විසින් එම ඉඩම් විකිණිමෙන් ලත් මුදලින් ගෙවිය යුතු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා. මේ පිළිබඳව වෙනත් අදහස් ඇත්නම් ඉදිරිපත් කරන ලෙසත් එසේ නොමැතිනම් එම යෝජනාව සභා සම්මත කර ගන්නා ලෙසත් මා ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමා

කිසිත් අදහසක් ඉදිරිපත් නොවන බව හා විරුද්ධත්වයක් නොමැති බව පෙනීයනවා.

තීරණය

ඒ අනුව 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 154 (1) වැනි උප වගන්තියෙන් ප්‍රාදේශීය සභා වලට ලැබී ඇති බලතල ප්‍රකාර,ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත පිහිටියාවූ යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු, ඔහුගේ සේවකයකු හෝ අනු නියෝජිතයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍ය ආකාරයකින් විකුණනු ලබන අවස්ථාවක ඒ ඉඩම් විකිණීමෙන් ලද මුදලෙන් සියයට එක (1%)ක සමාන බද්දක් 2023 වර්ෂයට පනවා අය කිරීමටත්, එකී බදු මුදල විකුණුම්කරු විසින් හෝ වෙන්දේසිකරු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයා හෝ අනු නියෝජිතයා විසින් එම ඉඩම් විකිණීමෙන් ලත් මුදලින් ගෙවිය යුතු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05:01:01:VII 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 118 වගන්තිය ප්‍රකාරව සහ මෙම සභාව විසින් පිළිගත් පොදු සම්මත අතුරු ව්‍යවස්ථාවේ 34 වන අතුරු ව්‍යවස්ථාව අනුව ජල ගාස්තු අයකිරීම යෝජනාව සභාගත කරන ලදි.

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 118 වැනි වගන්තිය ප්‍රකාරව, සහ මෙම සභාව විසින් පිළිගත් පොදු සම්මත අතුරු ව්‍යවස්ථාවේ 34 වන අතුරු ව්‍යවස්ථාව අනුව පහත සඳහන් පරිදි 2023 වර්ෂය සඳහා ජල ගාස්තු අයකිරීමට ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශිය සභාව යෝජනා කරන්නීය.

1. ගුරුත්ව ජල සේවාවලින් ඇති ජල සැපයුම් සඳහා ගාස්තු අයකිරීම - මසකට ගාස්තුව රු. 500.00
2. ලැන්ටන්හිල් ප්‍රදේශයේ ජල සැපයුම් සඳහා ගාස්තු අයකිරීම - මසකට ගාස්තුව රු. 500.00
3. ජල මීටර් ඇති ජල සේවාවන් සඳහා ගාස්තු අයකිරීම -

**(i)** ගෘහ/පාසල්/ආගමික ස්ථාන/රජයේ නිවාස/පෙර පාසල් - සෑම ජල සේවාවක් සඳහා රු.250 ක මාසික ස්ථාවර ගාස්තුවක් ගෙවිය යුතුය.

| | රු. ශත |
|---|---|
| ඒකක 0 සිට ඒකක 10 දක්වා ඒකකයක් | 25.00 |
| ඒකක 11 සිට ඒකක 20 දක්වා ඒකකයක් | 35.00 |
| ඒකක 21 වැඩි වන විට ඒකකයක් | 45.00 |

**(ii)** වාණිජ ආයතනය/රජයේ ආයතන :

| | |
|---|---|
| මාසික ස්ථාවර ජල ගාස්තුව | 350.00 |
| සෑම ඒකකයක් සඳහාම | 75.00 |

**(iii)** කාර්මික ආයතන/ඉදිකිරීම් වැඩ භූමි:

| | |
|---|---|
| මාසික ස්ථාවර ජල ගාස්තු | 350.00 |
| සෑම ඒකකයක් සඳහාම | 75.00 |

**(iv)** ජල මීටර් සවිකොට ජලය සපයන ජලනළ ක්‍රමයක් ඔස්සේ ජල මීටර් සවිකරවාගෙන නොමැති ජල සැපයුමක් සඳහා මසකට ජල ගාස්තුව 750.00

**(v)** ජලනල විසන්ධි කර ඇති අවස්ථාවක නැවත සන්ධි කිරීම සඳහා ගාස්තු 2000.00

**(vi)ජලනල එලීම සඳහා මාර්ග පළුදු කිරීමේ ගාස්තු :**

**ජලනල එලීම සඳහා පළුදු කිරීම - දැනට අයකරනු ලබන මුදල්**

| | | |
|---|---|---|
| | | රු. ශත |
| 01. පස් පාරක් කැණීමට පළල අඩි 02 ක් හා දික් අඩි 01 කට | - | 500.00 |
| 02. තාර පාරක් හරහා පළල අඩි 02 ක් හා දික් අඩි 01 කට | - | 1500.00 |
| 03. කොන්ක්‍රීට් මාර්ගයක පළල අඩි 02 ක් හා දික් අඩි 01 කට | - | 1000.00 |
| 04. මාර්ග උරහිස පළුදු කිරීම 2"×2" වලක් සඳහා | - | 2000.00 |
| 05. පස් පාරක් මාර්ග උරහිස දිගේ කැණීමට අඩි 25ක් දක්වා | - | 5000.00 |
| -වැඩිවන අඩියකට | - | 10.00 බැගින් |
| 06.කැටගල් සහිත මාර්ගයක පළල අඩි 2ක් හා දික් අඩි 1කට | - | 1500.00 |
| 07. කාපට් පාරක් කැණීමට පළල අඩි 02 ක් හා දික් අඩි 01 කට | - | 7500.00 |

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ. අජිත් ප්‍රියන්ත බණ්ඩාර මහතා</u>

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

<u>ගරු සභාපතිතුමා</u>

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 118 වැනි වගන්තිය ප්‍රකාරව, සහ මෙම සභාව විසින් පිළිගත් පොදු සම්මත අතුරු ව්‍යවස්ථාවේ 34 වන අතුරු ව්‍යවස්ථාව අනුව ඉහත සඳහන් පරිදි 2023 වර්ෂය සඳහා ජල ගාස්තු අයකිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා. මේ පිළිබඳව අදහස් දැක්වීමට අවස්ථාව ලබා දෙනවා.

<u>ගරු සභාපතිතුමා</u>

වෙනත් අදහසක් ඉදිරිපත් නොවනබව හා විරුද්ධත්වයක් නොමැති බව පෙනීයනවා.

<u>තීරණය</u>

ඒ අනුව 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 118 වගන්තිය ප්‍රකාරව සහ මෙම සභාව විසින් පිළිගත් පොදු සම්මත අතුරු ව්‍යවස්ථාවේ 34 වන අතුරු ව්‍යවස්ථාව අනුව 2023 වර්ෂය සඳහා ජල ගාස්තු අය කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>05:01:01:VIII 2023 වර්ෂය සඳහා දැන්වීම් පුවරු හා ප්‍රදර්ශන ගාස්තු පැනවීම යෝජනාව සභාගත කරන ලදි.</u>

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 221(අ), 122(1) හා 126 වැනි වගන්ති වලින් පැවරී ඇති බලතල අනුව හා 1988.08.23 වැනි දිනැති අංක 520/7 දරණ පළාත් පාලන අති විශේෂ ගැසට් පත්‍රයේ IV(ආ) කොටසේ ප්‍රකාශයටපත් කරන ලදුව ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවල

දෙවන කොටසේ අංක 39 දරණ අතුරු ව්‍යවස්ථාවේ 3(2) යටතේ ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා සීමාව තුළ ප්‍රචාරක දැන්වීම් ඉදිකිරීමක් හා ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් ගාස්තු 2023.01.01 වැනි දින සිට අය කිරීමට ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

| | |
|---|---|
| | රු.ශත |
| 01. බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරනු ලබන ඕනෑම ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග අඩියකට | 100.00 |
| 02. ලෑල්ලක් හෝ ආධාරකයක් මගින් ප්‍රදර්ශනය කරනු ලබන ඕනෑම ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග අඩියකට | 50.00 |
| 03. බිත්තියක හෝ පුවරුවක හෝ ලෑල්ලක ප්‍රදර්ශනය කරනු ලබන විදුලි ආලෝක සහිත ප්‍රචාරක දැන්වීමක් සඳහා | 100.00 |
| 04. ව්‍යාපාරික ස්ථාන අනුබද්ධිතව ප්‍රචාරණය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා වර්ග අඩියකට | 85.00 |
| 05. රෙදිවලින් අඳිනු ලබන ඩිජිටල් ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග අඩියකට | 100.00 |

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය පට්ටිපොල සුමනරතන හිමි

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 221(අ), 122(1) හා 126 වැනි වගන්ති වලින් පැවරී ඇති බලතල අනුව හා 1988.08.23 වැනි දිනැති අංක 520/7 දරණ පළාත් පාලන අති විශේෂ ගැසට් පත්‍රයේ IV(ආ) කොටසේ ප්‍රකාශ යටපත් කරන ලදුව ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවල දෙවන කොටසේ අංක 39 දරණ අතුරු ව්‍යවස්ථාවේ 3(2)යටතේ ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා සීමාව තුළ ප්‍රචාරක දැන්වීම් ඉදිකිරීමක් හා ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් ගාස්තු 2023.01.01 වැනි දින සිට අය කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා. මේ පිළිබඳව අදහස් දැක්වීමට අවස්ථාව ලබා දෙනවා.

ගරු සභාපතිතුමා

වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව හා විරුද්ධත්වයක් නොමැති බව පෙනීයනවා.

තීරණය

ඒ අනුව 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 221(අ), 122(1) හා 126 වැනි වගන්ති වලින් පැවරී ඇති බලතල අනුව හා 1988.08.23 වැනි දිනැති අංක 520/7 දරණ පළාත් පාලන අති විශේෂ ගැසට් පත්‍රයේ IV(ආ) කොටසේ ප්‍රකාශ යටපත් කරන ලදුව ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවල දෙවන කොටසේ අංක 39 දරණ අතුරු ව්‍යවස්ථාවේ 3(2)යටතේ ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා සීමාව තුළ ප්‍රචාරක දැන්වීම් ඉදිකිරීමක් හා ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් ගාස්තු 2023.01.01 වැනි දින සිට අය කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05:01:01: IX 2023 වර්ෂය සඳහා වෙනත් ගාස්තු පැනවීම යෝජනාව සභාගත කරන ලදි.

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතින් ගඟ ඉහළ කෝරළේ ප්‍රදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පහත උප ලේඛනයේ සඳහන් වෙනත් ගාස්තු 2022 වර්ෂයට අය කිරීමට ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

| පෝරම සහ වෙනත් ගාස්තු : | රු.ශත |
|---|---|
| **01.** ගොඩනැගිලි සැලසුම අනුමත කර ගැනීමේ ඉල්ලුම් පත්‍රයක් සඳහා | 1250.00 |
| **02.** විදුලි යෝග්‍යතා සහතිකයක් නිකුත් කිරීම | |
| නිවසක් සඳහා | 500.00 |
| ව්‍යාපාරික ස්ථානයක් සඳහා | 750.00 |
| **03.** කර්මාන්ත ගිවිසුම් පත්‍රයක් සඳහා ගාස්තු | 750.00 |
| **04.** කර්මාන්ත කොන්ත්‍රාත් සමිති ලියාංදිංචි ගාස්තු | 3000.00 |
| **05.** පරිසර ආරක්ෂණ බලපත්‍ර ඉල්ලුම්පත්‍රයක් සඳහා ගාස්තු | 1000.00 |
| **06.** වීථි රේඛා සහතිකය, නොපවරවා ගැනීමේ සහතිකය,ගොඩනැගිලි සීමා පිළිබඳ සහතිකය සඳහා ගාස්තු | 3000.00 |
| **07.** පුස්තකාල සාමාජිකත්වය සඳහා ඉල්ලුම්පත්‍ර ගාස්තු | 25.00 |
| **08.** පුස්තකාල සාමාජික ගාස්තු | |
| - වැඩිහිටි සඳහා | 100.00 |
| -ළමා සඳහා | 50.00 |
| **09.** පුස්තකාල සාමාජිකත්වය අලුත් කිරීම සඳහා ගාස්තු (අවු 2කට වතාවක්) | |
| -වැඩිහිටි සඳහා | 50.00 |
| -ළමා සඳහා | 25.00 |
| පුස්තකාල ප්‍රමාද ගාස්තු දිනකට එක් පොතක් සඳහා | 5.00 |
| **10.** පාපැදි බලපත්‍ර අයදුම්පත් ගාස්තු සඳහා | 46.00 |
| **11.** දැව කඳන් ප්‍රවාහනය කිරීමේ ගාස්තු (එක් ප්‍රවාහන වාරයක් සඳහා) | 5000.00 |
| **12.** සභාව සතු දේපල, භූමි ප්‍රවර්ධන වැඩසටහන් සඳහා ලබාදීමේ දී දිනකට | 5000.00 |
| **13.** උත්සවයක් සඳහා සතුන් මැරීම - එක් ගවයෙක් /එක් එළුවෙක් වෙනුවෙන් | 3000.00 |
| **14.** ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර අයදුම් පත්‍ර | 350.00 |
| **15.** අනතුරුදායක හා අවහිර ගස් අයදුම්පත්‍ර | 600.00 |
| **16.** ඇත්ගාල හා කුරුදුවත්ත ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලා කුලියට ලබාදීම දිනකට | |
| 1.ස්වේච්ඡා කටයුතු සඳහා | 3500.00 |
| 11..වෙනත් කටයුතු සඳහා | 5500.00 |
| **17.** ත්‍රී රෝද රථ ස්ටිකර් ගාස්තු | 250.00 |
| **18.** පෝස්ටර්, බැනර් ඉවත් කිරීමේ ගාස්තු | 500.00 |
| **19.** පුටු එකක් කුලියට දීම - දිනකට | 25.00 |
| **20.** කොඩි කණු එකක් කුලියට දීම - දිනකට | 150.00 |
| **21.** කුරුදුවත්ත ක්‍රීඩා පිටිය කුලියට දීම - දිනකට | 8000.00 |
| නැරඹුම් මධ්‍යස්ථානය සමඟ නැරඹුම් කාමරය | 7000.00 |
| 22. ඇත්ගාල ක්‍රීඩා පිටිය කුලියට දීම - දිනකට | 8000.00 |
| නැරඹුම් මධ්‍යස්ථානය සමඟ නැරඹුම් කාමරය | 6000.00 |
| 23.ජල බවුසරය කුලියට දීම - මූලික ගාස්තුව | 6500.00 |
| එක් වරකට බවුසරය පැය 4 ක් තුළ රඳවා ගැනීමේ ගාස්තුව | 3500.00 |
| එක් වරකට බවුසරය පැය 6 ක් තුළ රඳවා ගැනීමේ ගාස්තුව | 5000.00 |
| පැය 6 සිට වැඩිවන සෑම පැයක් සඳහා බවුසරය රඳවා ගැනීමේ ගාස්තුව | 500.00 |
| කිලෝ මීටර් 1 ක් ගමන් කිරීම සඳහා | 1340.00 |
| 24.සැලසුම් ශිල්පීන් ලියාපදිංචි කිරීම | 7500.00 |
| 25.සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම | 2500.00 |
| 26. ජල සම්බන්ධතා අයදුම්පත්‍ර ගාස්තුව | 500.00 |
| 27.ඔප්පු සාරාංශ අයදුම්පත්‍ර | 1000.00 |
| 28.ගොඩනැගිලි සැලසුම් අනුමත කර ගැනීමේ සංවර්ධන බලපත්‍ර ඡායාපිටපතක් සඳහා | 1000.00 |
| 29.කාය වර්ධන මධ්‍යස්ථානයේ මාසික සාමාජික ගාස්තුව | 1000.00 |
| 30.සති පොළ පරිශ්‍රය භාවිතය එක් දිනක් සඳහා | 100.00 |

31.ඊ නැණ පියස පරිගණක පාඨමාලාව — සය මාසික 6000.00
ත්‍රෛයිමාසික 3000.00

32.මැහුම් පාඨමාලාව සාමාජික ගාස්තු 100.00

33.ඝන අපද්‍රව්‍ය කළමණාකරණ මධ්‍යස්ථානයෙන් නිපදවනු ලබන කාබනික පොහොර වෙළඳපල පවතින මිල අනුව අලෙවි කිරීම.

34.පස් ප්‍රවාහනය සඳහා ගල්/වැලි ප්‍රවාහන ගාස්තු (කියුබ් 1 කට) 1000.00

35. ගොඩනැගිලි ඉදිකිරීම්/ විශේෂ ව්‍යාපෘති හා ඉඩම් අනු බෙදීම් කිරීමේදී ගාස්තු පැනවීම-

| *සංවර්ධන කාර්යයේ ස්වභාවය* | *භාවිත කළ යුතු ආකෘති පත්‍රය* | *අය කළ යුතු ගාස්තු රු.ශත* |
|---|---|---|

1. ගොඩනැගිලි සැලසුම් පරික්ෂා කිරීම හා අනුමත කිරීමේ ගාස්තු :

| | | |
|---|---|---|
| (i) | නේවාසික සඳහා - ව.අ. 500 ට අඩු නම් ව.අ. 1කට | 5.00 බැගින් |
| | ව.අ. 500 ට වැඩි නම් ව.අ. එකක් සඳහා | 7.50 බැගින් |
| (ii) | ව්‍යාපාරික කාර්යක් සඳහා - ව.අ.500ට අඩු නම් ව.අ.1 ක් සඳහා | 15.00 බැගින් |
| | ව.අ. 500ට වැඩි නම් ව.අ.1ක් සඳහා | 17.00 බැගින් |
| (iii) | ගොඩනැගිල්ලක් ඉදිකිරීම දීර්ඝ කිරීමේ ගාස්තු - අවු.01ක් සඳහා | 3000.00 |

2.සංවර්ධන අවසරපත්‍ර නිකුත් කිරීම ඃ පෙරසැරි ගාස්තු

ඉඩම් අනු කොටස්වලට බෙදීම "අ"

| 1. බිම් කට්ටිය ප්‍රමාණය | එක් බිම් කට්ටියකට අයකළ යුතු මුදල (මාර්ග කාණු හා පොදු බිම් කොටස් හැර ) |
|---|---|
| ❖ පර්චස් 6-12 | රු. 750.00 |
| ❖ පර්චස් 12-24 | රු. 1200.00 |
| ❖ පර්චස් 25-40 | රු. 1500.00 |
| ❖ පර්චස් 41-160 | රු. 7500.00 |
| ❖ අක්කර1-5 | රු. 10000.00 |
| ❖ අක්කර6-10 | රු. 12500.00 |
| ❖ අක්කර11-15 | රු. 15000.00 |
| ❖ අක්කර16-20 | රු. 30000.00 |
| ❖ අක්කර 21ට වැඩි | රු. 45000.00 |

3.මූලික සැලසුම් නිරාකරණ අනුමැතිය - විශේෂ ව්‍යාපෘති/ විශාල ප්‍රමාණයේ ඉඩම් කට්ටි කිරීම්

| | |
|---|---|
| අක්කර 1 - 5 ත් අතර | රු. 20,000.00 |
| අක්කර 5 -10 ත් අතර | රු. 22,500.00 |
| අක්කර 10 ට වැඩි | රු. 35,000.00 |

1.ඉඩම් අනුබෙදුම් සඳහා "ඇ" (1) පර්චස් 40 ට අඩු ඉඩම් සඳහා රු.3500.00

| | |
|---|---|
| පර්චස් 40-200 දක්වා | රු.12,500.00 |
| පර්චස් 200-400 දක්වා | රු.15,000.00 |
| පර්චස් 400 ට වැඩි | රු.25,000.00 |

I. විශේෂ සංවර්ධන ව්‍යාපෘති 01ක් සඳහා
දුරකතන කුළුණු/කුඩා විදුලිබලාගාර හා වෙනත් රු.40,000.00

## අනුකූලතා සහතික ප්‍රදානය කිරීමේ ගාස්තු

4.අනුකූලතා සහතික නිකුත් කිරීම (සෑම ඉදිකිරීමක් /සංවර්ධනයක්සඳහාම අනුකූලතා සහතික ලබා ගත යුතුය.)

| | | |
|---|---|---|
| I. | ඉඩම් අනුබෙදුම් | - පළමු බිම් කොටසට රු.1500.00 ක් සහ ඊට වැඩි වන සෑම බිම් කට්ටියකටම රු.1000.00 බැගින් |
| II. | නේවාසික ගොඩනැගිලි අනුකූලතා සහතිකයක් සඳහා | - වර්ග මීටර් 100 ක් සඳහා රු.2000.00 බැගින් |
| III. | වාණිජ හා වෙනත් ඉදිකිරීම් | - වර්ග මීටර් 100 ට අඩු රු.6500.00ක් සහ<br>- ඊට වැඩිවන සෑම වර්ග මීටර් 1 කට රු.25.00 බැගින් |
| IV. | මායිම් තාප්ප/ආරක්ෂක බැම් ඉදිකිරීම | - පළමු දික් මීටර් 100 සඳහා රු.5000.00 ක් සහ ඊට වැඩි වන සෑම මීටර් 1 කටම රු.50.00 බැගින් |
| V. | ඉඩම්/කුඹුරු ගොඩ කිරීම | - ව.මී.150 ට අඩු රු.15,000.00 ක් සහ ඊට වැඩි වන සෑම ව.මී. 1 කට රු.150.00 බැගින් |
| VI. | විශේෂ ව්‍යාපෘති | - කුඩා පරිමාණ සඳහා රු.7500.00<br>- මධ්‍ය පරිමාණ රු.15,000.00<br>- මහා පරිමාණ රු.50,000.00 |

## අනවසර ඉදිකිරීම් ආවරණ අනුමැති ගාස්තු

ඉදිකිරීම් අදියර

5.නිසි සංවර්ධන බලපත්‍රයකින් තොරව ගොඩනැගිලි

| | නේවාසික ඉදිකිරීම/කොටස් එකතු කිරීම/නැවත ඉදිකිරීම සඳහා ගාස්තු සඳහා ගාස්තු | ව.අඩි 1ක් | වාණිජ හා වෙනත් ව.අඩි 1ක් සඳහා ගාස්තු |
|---|---|---|---|
| | | රු.ශත | රු.ශත |
| පළමු මහල | අත්තිවාරම් වැඩ පමණක් (කයිරු මට්ටම) | 6.00 | 15.00 |
| | ජනෙල් මට්ටම දක්වා | 7.00 | 17.50 |
| | වහල මට්ටම දක්වා | 8.00 | 20.00 |
| | සම්පූර්ණ කොට ඇති විට | 10.00 | 25.00 |
| ඉහළ මහල | ජනෙල් මට්ටම දක්වා | 13.00 | 31.00 |
| | වහල මට්ටම දක්වා | 14.00 | 35.00 |
| | සම්පූර්ණ කොට ඇති විට | 15.00 | 60.00 |

| | දික් අඩි 1කට | දික්අඩි 1කට |
|---|---|---|
| තාප්ප ඉදිකිරීමේ දී(අඩි 8ක් උස ) (වර්ග අඩි 1 කට රු.3.12 බැගින්) | 25.00 | 25.00 |

සංවර්ධනය නොකල ඉඩම් සඳහා බදු (5%)

| | | |
|---|---|---|
| ඉඩම්/කුඹුරු ඉඩම් ගොඩ කිරීම සඳහා | - සෑම වර්ග මීටර් 150කට | රු.10,000.00 බැගින් |
| විශේෂ සංවර්ධන ව්‍යාපෘති | - සෑම මිලියන 05 කටම | රු. 20,000.00 බැගින් |
| දුරකථන කුළුණු/විදුලි සංදේශ කුළුණු සඳහා | - උස සෑම මීටර් 05 කට | රු.30,000.00 බැගින් |

5. I. අනුකූලතා සහතික නොමැතිව පදිංචි වීම, භාවිත කිරීම හෝ ප්‍රයෝජනයට ගැනීම (නේවාසික/සුළු වාණිජ) — රු.4000.00

II. අනුකූලතා සහතිකය නොමැති විශේෂ ව්‍යාපෘති ආදායම් ඉපදවීම/ඉඩම් කට්ටි කර විකිණීම — රු.20000.00

| විශේෂ ව්‍යාපෘති | මිලියන 05 සිට 10 දක්වා රු.ශත |
|---|---|
| I. රුපියල් මිලියනය දක්වා වූ ඉදිකිරීම් (කුඩා පරිමාණ) | 12,000.00 |
| II. රුපියල් මිලියන 01 සිට 10 දක්වා (මධ්‍යම පරිමාණ) | 17,500.00 |
| III. රුපියල් මිලියන 10ට වැඩි (මහා පරිමාණ) | 350,000.00 |

<u>2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනත ලබාදීම සඳහා ගාස්තු අය කිරීම.</u>

උක්ත පනතින් නියම කර ඇති විධි විධාන අනුව තොරතුරු ලබාදීම සඳහා පහත පරිදි ගාස්තු අය කරනු ලැබේ.

1.ඡායා පිටපත් ගැනීම -

(අ).**A4** (සෙ.මී.21 Xසෙ.මී.29.7) කඩදාසියක හෝ ඊට වඩා කුඩා ප්‍රමාණයේ කඩදාසියක සපයනු ලබන තොරතුරු සඳහා තනි පැත්තක් රු.2.00 සහ එකම කොළයේ දෙපැත්ත රු.4.00 ක් වේ.

(ආ).ලීගල් ප්‍රමාණයේ(සෙ.මී.21.59Xසෙ.මී.35.56)කඩදාසියක සහ**A3** ප්‍රමාණයේ(සෙ.මී.29.7X සෙ.මී.42)කඩදාසියක සපයනු ලබන තොරතුරු සඳහා තනි පැත්තක් රු.4.00 සහ එකම කොළයේ දෙපැත්ත රු.8.00 ක් වේ.

(ඇ).ඉහත සඳහන් කළ ප්‍රමාණයට වඩා විශාල කඩදාසියක සපයනු ලබන තොරතුරක් සඳහා සැබෑ වියදම අය කෙරේ.

11.මුද්‍රිත පිටපත් ලබාගැනිම -

(අ).**A4** (සෙ.මී.21 Xසෙ.මී.29.7) කඩදාසියක හෝ ඊට වඩා කුඩා ප්‍රමාණයේ කඩදාසියක සපයනු ලබන තොරතුරු සඳහා තනි පැත්තක් රු.4.00 සහ එකම කොළයේ දෙපැත්ත රු.8.00 ක් වේ.

(ආ).ලීගල් ප්‍රමාණයේ (සෙ.මී.21.59Xසෙ.මී.35.56) කඩදාසියක සහ **A3** (සෙ.මී.29.7Xසෙ.මී.42) කඩදාසියක සපයනු ලබන තොරතුරු සඳහා තනි පැත්තක් රු.4.00 සහ එකම කොළයේ දෙපැත්ත රු.8.00 ක් වේ.

(ඇ).ඉහත සඳහන් කළ ප්‍රමාණයට වඩා විශාල කඩදාසියක සපයනු ලබන තොරතුරක් සඳහා සැබෑ වියදම අය කෙරේ.

111.තොරතුරු ඉල්ලීම සිදුකරනු ලබන පුරවැසියා විසින් සපයනු ලබන ඩිස්කට්ටුවක් (Diskette),සංයුක්ත තැටියක්(compact disc),යුඑස්බි දත්ත පරිවාහකයක් (USB mass drive) හෝ එබඳු වෙනත් ඉලෙක්ට්‍රොනික උපාංගයක් වෙත තොරතුරු පිටපත් කරදීම පිණිස මේ එක් එක් අයිතමයක් සඳහා රු.20.00 බැගින් අය කෙරේ.

1V.පොදු අධිකාරිය විසින් සපයනු ලබන ඩිස්කට්ටුවක්(Diskette), සංයුක්ත තැටියක් (compact disc),යුඑස්බි දත්ත පරිවාහකයක්(USB mass drive) හෝ එබඳු වෙනත් ඉලෙක්ට්‍රොනික උපාංගයක් වෙත පිටපත්කර දීම සඳහා සැබෑ වියදම අය කෙරේ.

V.යම්කිසි ලියවිල්ලක් හෝ විෂයයක් පරීක්ෂා කරන්නේ නම් හෝ අධ්‍යයනය කරන්නේ නම් හෝ ඉදිකිරීම් ක්ෂේත්‍රයක් පරීක්ෂාවකට ලක් කරන්නේ නම් පැයකට රු.50.00 බැගින් අය කෙරෙනු ලබන අතර,

එකී අධ්‍යයනය/පරීක්ෂාව සඳහා පැයකට වඩා වැඩි කාලයක් ගතවන්නේ නම් පළමු පැය සඳහා ගාස්තු අය නොකෙරේ.මෙය සිදුකරනුයේ නොමිලේ එබඳු පරීක්ෂාවක් සිදු කිරීමට ඉඩ සැලසු පොදු අධිකාරීන්ගේ එකී භාවිතයට අගතියක් නොවන පරිදිය.තව ද එකී පොදු අධිකාරීන්ගේ එකී භාවිතය මෙම උප රීතිය තිබියදී වුවද එසේම පවතිනු ඇත.

V1.නියැදි (සාම්පල) හෝ ආකෘති(මොඩල) සඳහා සත්‍ය වියදම අය කෙරෙනු ඇත.

V11.ඊ-මේල් (විද්‍යුත් තැපෑල) මගින් සපයනු ලබන තොරතුරු සඳහා ගාස්තු අය නොකෙරේ.

<u>දුරකථන කුළුණු සහ පාලම් සඳහා ගාස්තු පැනවීම</u>

දුරකථන කුළුණු/ඇන්ටෙනා කුළුණු/විදුලි සංදේශ කුළුණු /පාලම් ඉදිකිරීම සඳහා ගාස්තු අයකිරීම:

| | |
|---|---|
| 1.සංවර්ධන අවසර පත්‍ර නිකුත් කිරීම සඳහා | - උස මීටර් 5-20 දක්වා රු.10,000.00 ක් සහ වැඩිවන එකකට රු.300 බැගින් |
| 2.අනුකූලතා සහතික නිකුත් කිරීම සඳහා | - උස මීටර් 5-20 දක්වා රු.10,000.00ක් සහ වැඩිවන සෑම මීටර් එකකට රු. 350.00 බැගින් |
| 3. ස්ථාපිත කර ඇති දුරකථන කුළුණු/ඇන්ටෙනා කුළුණු ඉදිකිරීම/විදුලි සංදේශ කුළුණු සඳහා වාර්ෂිකව ව්‍යාපාර බදු ගාස්තුව | - රු.3,000.00 |
| 4. පාලම් සැකසීමේදී වර්ග අඩියක් සඳහා | - රු.75.00 බැගින් |

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ. සුමේධ අලුත්ගමගේ මහතා</u>

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

<u>ගරු සභාපතිතුමා</u>

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතින් ගඟ ඉහළ කෝරළේ ප්‍රදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉහත උප ලේඛනයේ සඳහන් වෙනත් ගාස්තු 2022 වර්ෂයේ අය කළ මිළ ගණන්ම 2023 වර්ෂයට අය කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා. මේ පිළිබඳව අදහස් දැක්වීමට අවස්ථාව ලබා දෙනවා.

<u>ගරු සභාපතිතුමා</u>

වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව හා විරුද්ධත්වයක් නොමැති බව පෙනීයනවා.

තීරණය

ඒ අනුව 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතින් ගඟ ඉහළ කෝරළේ ප්‍රදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉහත උප ලේඛනයේ සඳහන් වෙනත් ගාස්තු 2023 වර්ෂයට අය කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05:01:01:X 2023 වර්ෂයට සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම යෝජනාව සභාගත කරන ලදී.

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වන වගන්තිය සහ හතරවන උපලේඛනයේ විධිවිධාන වලින් ප්‍රාදේශීය සභා වලට ලැබී ඇති බලතල ප්‍රකාර, ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2023 වර්ෂයේදී පහත උප ලේඛනයේ I වන තිරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකු මත ම, එහි II වන තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත බද්දක් 2023 වර්ෂය සඳහා පනවා අය කිරිමට ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

| | Iවන තීරුව | II වන තීරුව | |
|---|---|---|---|
| (1) | | | |
| I. | මෝටර් රථයක්,මෝටර් ට්‍රයිසිකාරයක්, මෝටර් ලොරියක් ,මෝටර් බයිසිකලයක් ,කරත්තයක් ,ජින් රික්ෂෝවක්,බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා | රු. | 25.00 |
| II. | සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා - | | |
| | (අ) වෙළඳ කාර්යයන් සඳහා යොදවන්නේ නම් | රු. | 25.00 |
| | (ආ) වෙළඳ නොවන කාර්යයන් සඳහා යොදවන්නේ නම් | රු. | 4.00 |
| III. | සෑම කරත්තයක් සඳහා | රු. | 20.00 |
| IV. | සෑම අත්කරත්තයක් සඳහා | රු. | 10.00 |
| V. | සෑම රික්ෂෝවක් සඳහා | රු. | 7.50 |
| VI. | සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා | රු. | 15.00 |
| VII. | සෑම අලියෙකු හෝ ඇතෙකු සඳහා | රු. | 50.00 |

(2) විෂ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන ,වීල් බැරෝ හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්ය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළඳ කාර්ය සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී සුබෝධා ලක්ෂාණි රිබේරා මහත්මිය

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වන වගන්තිය සහ හතරවන උපලේඛනයේ විධිවිධාන වලින් ප්‍රාදේශීය සභා වලට ලැබී ඇති බලතල ප්‍රකාර, ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2022 වර්ෂයේදී ඉහත උප ලේඛනයේ I වන තිරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ

සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකු මත ම, එහි II වන තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත බද්දක් 2023 වර්ෂය සඳහා පනවා අය කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා. මේ පිළිබඳව අදහස් දැක්වීමට අවස්ථාව ලබා දෙනවා.

<u>ගරු සභාපතිතුමා</u>

වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව හා විරුද්ධත්වයක් නොමැති බව පෙනීයනවා.

<u>තීරණය</u>

ඒ අනුව 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වන වගන්තිය සහ හතරවන උපලේඛනයේ විධිවිධාන වලින් ප්‍රාදේශීය සභා වලට ලැබී ඇති බලතල ප්‍රකාර, ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2022 වර්ෂයේදී ඉහත උප ලේඛනයේ I වන තිරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකු මත ම, එහි II වන තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත බද්දක් 2023 වර්ෂය සඳහා පනවා අය කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>05:01:01:XI 2023 වර්ෂය සඳහා වාහන නවතා තැබීම සඳහා ගාස්තු පැනවීම යෝජනාව සභාගත කරන ලදි.</u>

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 221(අ), 122(1) හා 126 වැනි වගන්ති වලින් පැවරී ඇති බලතල අනුව හා 1988.08.23 වැනි දිනැති අංක 520/7 දරණ පළාත් පාලන අති විශේෂ ගැසට් පත්‍රයේ IV(ආ) කොටසේ ප්‍රකාශයට පත් කරන ලදුව ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවල දෙවන කොටසේ අංක 39 දරණ අතුරු ව්‍යවස්ථාවේ 06 යටතේ ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා සීමාව තුළ වාහන නවතා තැබීම වෙනුවෙන් පහත උප ලේඛනයේ දැක්වෙන ගාස්තු 2023.01.01 වැනි දින සිට අය කිරීමට ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

| | | එක්වරක් පමණක් ගෙවිය යුතු ලියාපදිංචි ගාස්තු රු. | වාර්ෂික බලපත්‍ර ගාස්තු ප්‍රමාණය රු. |
|---|---|---|---|
| **1.** | ලොරියක් සඳහා | 5000.00 | 6000.00 |
| **2.** | වෑන් රථයක් සඳහා | 5000.00 | 3600.00 |
| **3.** | ට්‍රේලරයක් සහිත ට්‍රැක්ටරයක් සඳහා | 5000.00 | 3600.00 |
| **4.** | කාර් එකක් සඳහා | 5000.00 | 3600.00 |
| **5.** | අත් ට්‍රැක්ටරයක් සඳහා | 5000.00 | 3600.00 |
| **6.** | ත්‍රිරෝද රථයක් සඳහා | 5000.00 | 3600.00 |

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.පී. කොල්වින් සිල්වා මහතා</u>

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

<u>ගරු සභාපතිතුමා</u>

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 221(අ), 122(1) හා 126 වැනි වගන්ති වලින් පැවරී ඇති බලතල අනුව හා 1988.08.23 වැනි දිනැති අංක 520/7 දරණ පළාත් පාලන අති විශේෂ ගැසට් පත්‍රයේ IV(ආ) කොටසේ ප්‍රකාශයට පත් කරන ලදුව ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවල

දෙවන කොටසේ අංක 39 දරණ අතුරු ව්‍යවස්ථාවේ 06 යටතේ ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා සීමාව තුළ වාහන නවතා තැබීම වෙනුවෙන් ඉහත උප ලේඛනයේ දැක්වෙන ගාස්තු 2023.01.01 වැනි දින සිට අය කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා. මේ පිළිබඳව අදහස් දැක්වීමට අවස්ථාව ලබා දෙනවා.

ගරු සභාපතිතුමා

වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව හා විරුද්ධත්වයක් නොමැති බව පෙනීයනවා.

තීරණය

ඒ අනුව 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 221(අ), 122(1) හා 126 වැනි වගන්ති වලින් පැවරී ඇති බලතල අනුව හා 1988.08.23 වැනි දිනැති අංක 520/7 දරණ පළාත් පාලන අති විශේෂ ගැසට් පත්‍රයේ IV(ආ) කොටසේ ප්‍රකාශයට පත් කරන ලදුව ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවල දෙවන කොටසේ අංක 39 දරණ අතුරු ව්‍යවස්ථාවේ 06 යටතේ ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා සීමාව තුළ වාහන නවතා තැබීම වෙනුවෙන් ඉහත උප ලේඛනයේ දැක්වෙන ගාස්තු 2023.01.01 වැනි දින සිට අය කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05:01:01: XII 2023 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම යෝජනාව සභාගත කරන ලදි.

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 153 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය අනුව ප්‍රාදේශීය සභා වලට ලැබී ඇති බලතල ප්‍රකාර, ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි ගොඩනැගිලි ඉදිකිරීමට හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක-

(අ) ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැතිනම් හෝ,

(ආ) ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත්කර නොමැති විටෙක, හෝ

(ඇ) සැබැවින්ම ගොඩනැගිලි වලින් ආවරණයවූ ඒ ඉඩමේ බිම් ප්‍රමාණය,ඒ ඉඩමේ මුළු බිම් ප්‍රමාණයට නියමිත සමානුපාතයට වඩා අඩු සමානුපාතයක් ප්‍රාදේශීය සභා යෝජනා සම්මතයක් මගින් දරන්නාවූ හෝ ඒ ඉඩමේ ඉදිකර ඇති ගොඩනැගිලිවලට ඇත්ත වශයෙන් ම යටවී ඇති, බිම් ප්‍රමාණය සහ ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය 10% වඩා අඩු වන්නේනම්, එකී ඉඩම,සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැළකීමට සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම් මත 2023 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ,භූමියේ ප්‍රාග්ධනය අගයෙන් සියයට එක(1%)ක වාර්ෂික බද්දක් පැනවීමටත්, එකී සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද 2023 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට විධාන කළයුතු යැයි ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩි.පී.ජී.ඩබ්.ජී.පී. ගුරුගේ මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 153 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය අනුව ප්‍රාදේශීය සභා වලට ලැබී ඇති බලතල ප්‍රකාර, ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි ගොඩනැගිලි ඉදිකිරීමට

හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැතිනම් හෝ ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත්කර නොමැති විටෙක, හෝ සැබැවින්ම ගොඩනැගිලි වලින් ආවරණයවූ ඒ ඉඩමේ බිම් ප්‍රමාණය,ඒ ඉඩමේ මුළු බිම් ප්‍රමාණයට නියමිත සමානුපාතයට වඩා අඩු සමානුපාතයක් ප්‍රාදේශීය සභා යෝජනා සම්මතයක් මගින් දරන්නාවූ හෝ ඒ ඉඩමේ ඉදිකර ඇති ගොඩනැගිලිවලට ඇත්ත වශයෙන් ම යටවී ඇති, බිම් ප්‍රමාණය සහ ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය 10% වඩා අඩු වන්නේනම්, එකී ඉඩම,සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැළකීමට සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම් මත 2023 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ,භූමියේ ප්‍රාග්ධනය අගයෙන් සියයට එක(1%)ක වාර්ෂික බද්දක් පැනවීමටත්, එකී සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද 2023 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට විධාන කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා. මේ පිළිබඳව අදහස් දැක්වීමට අවස්ථාව ලබා දෙනවා.

<u>ගරු සභාපතිතුමා</u>

වෙනත් අදහසක් ඉදිරිපත් නොවනබව හා විරුද්ධත්වයක් නොමැති බව පෙනීයනවා.

<u>තීරණය</u>

ඒ අනුව 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 153 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය අනුව ප්‍රාදේශීය සභා වලට ලැබී ඇති බලතල ප්‍රකාර, ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි ගොඩනැගිලි ඉදිකිරීමට හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැතිනම් හෝ ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත්කර නොමැති විටෙක, හෝ සැබැවින්ම ගොඩනැගිලි වලින් ආවරණයවූ ඒ ඉඩමේ බිම් ප්‍රමාණය,ඒ ඉඩමේ මුළු බිම් ප්‍රමාණයට නියමිත සමානුපාතයට වඩා අඩු සමානුපාතයක් ප්‍රාදේශීය සභා යෝජනා සම්මතයක් මගින් දරන්නාවූ හෝ ඒ ඉඩමේ ඉදිකර ඇති ගොඩනැගිලිවලට ඇත්ත වශයෙන් ම යටවී ඇති, බිම් ප්‍රමාණය සහ ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය 10% වඩා අඩු වන්නේනම්, එකී ඉඩම,සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැළකීමට සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම් මත 2023 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ,භූමියේ ප්‍රාග්ධනය අගයෙන් සියයට එක(1%)ක වාර්ෂික බද්දක් පැනවීමටත්, එකී සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද 2023 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට විධාන කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>05:01:01:XIII 2023 වර්ෂය සඳහා ඝන අපද්‍රව්‍ය බැහැර කරනු ලබන ස්ථාන සඳහා ගාස්තු පැනවීම යෝජනාව සභාගත කරන ලදි.</u>

1989 අංක 12 දරණ පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (I) වැනි උප වගන්තියේ (අ) ඡේදය සමඟ කියවිය යුතු 261 වන අධිකාරිය වන 1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ මධ්‍යම පළාත් සභවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2013-06-28 වැනි දින අංක 1816/42 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV (ආ)වැනි කොටසේ පළකරන නිවේදනයේ ප්‍රකාශයට පත්කරන ලද්දවූ ඝන අප ද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව තීරණ අංක 219 යටතේ 2015-12-30 වැනි දින ගඟ ඉහළ ප්‍රාදේශීය සභාව මගින් ගන්නා ලද තීරණයට අනුව 2016 මාර්තු මස 11 වැනි දින අංක 1958 දරණ ගැසට් පත්‍රය මගින් ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ක්‍රියාත්මක කිරීමට බල ගන්වා ඇත. ඉහත කී අතුරු ව්‍යවස්ථාවේ 07 වන වගන්තියේ අංක (IV)සහ (V) උප වගන්ති වලින් පැවරී ඇති බලතල අනුව පහත දැක්වෙන උප ලේඛනය පරිදි ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ව්‍යාපාරික ස්ථාන වලින් සහ අපද්‍රව්‍ය බැහැර කරනු ලබන ස්ථාන වලින් 2023 වර්ෂය සඳහා ගාස්තු අය කිරීමට ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

## උපලේඛනය

| අනුඅංකය | ව්‍යාපාරයේ ස්වභාවය | දිනකට කි.ග්‍රෑ. 1-5 දක්වා එකතු වන්නේ නම් මසකට අයවිය යුතු ගාස්තුව (රුපියල්) | දිනකට කි.ග්‍රෑ. 6-10 දක්වා එකතු වන්නේ නම් මසකට අයවිය යුතු ගාස්තුව (රුපියල්) | දිනකට කි.ග්‍රෑ. 11-19 දක්වා එකතු වන්නේ නම් මසකට අයවිය යුතු ගාස්තුව (රුපියල්) | දිනකට කි.ග්‍රෑ. 20-29 දක්වාඑකතු වන්නේනම් මසකට අයවිය යුතු ගාස්තුව (රුපියල්) | දිනකට කි.ග්‍රෑ. 30-39 දක්වාඑකතු වන්නේනම් මසකට අයවිය යුතු ගාස්තුව (රුපියල්) | දිනකට කි.ග්‍රෑ. 40 දක්වාඑකතු වන්නේනම් මසකට අයවිය යුතු ගාස්තුව (රුපියල්) | මාසිකව බැහැර කරනු ලබන මුළු කසල ප්‍රමාණය කි.ග්‍රෑ. 2500 ඉක්මවන ඕනෑම ආයතනයක් සඳහා (රුපියල්) |
|---|---|---|---|---|---|---|---|---|
| 01 | සාප්පු හා කාර්යාල | 250.00 | 300.00 | 350.00 | 400.00 | 450.00 | 750.00 | 30000.00 |
| 02 | හෝටල් | 250.00 | 500.00 | 1000.00 | 1500.00 | 2000.00 | 2500.00 | |
| 03 | එළවළු හා පළතුරු වෙළෙඳසැල් | 250.00 | 500.00 | 1000.00 | 1500.00 | 2500.00 | 5000.00 | |
| 04 | මස්, මාළු, කුකුළු මස් හෝ බිත්තර වෙළෙඳාම | 1000.00 | 1500.00 | 2000.00 | 2500.00 | 3000.00 | 3500.00 | |
| 05 | පදිකවෙළෙඳාම | 200.00 | 300.00 | 400.00 | 500.00 | 750.00 | 1000.00 | |
| 06 | පුද්ගලික බෙහෙත් ශාලා (සායනික අපද්‍රව්‍ය හැර) | 250.00 | 300.00 | 400.00 | 500.00 | 1000.00 | 1500.00 | |
| 07 | කර්මාන්තශාලා | 1000.00 | 1500.00 | 2000.00 | 2500.00 | 3000.00 | 5000.00 | |
| 08 | කැනීම්, ඉදිකිරීම් හා කඩාදැමීම. | 1000.00 | 2000.00 | 3000.00 | 4000.00 | 5000.00 | 6000.00 | |
| 09 | සුපර් මාර්කට් | 1500.00 | 2000.00 | 2500.00 | 3000.00 | 3500.00 | 4000.00 | |

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඒ. මහින්දරත්න අලුත්ගමගේ මහතා</u>

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

<u>ගරු සභාපතිතුමා</u>

1989 අංක 12 දරණ පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (I) වැනි උප වගන්තියේ (අ) ඡේදය සමඟ කියවිය යුතු 261 වන අධිකාරිය වන 1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2013-06-28 වැනි දින අංක 1816/42 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV (ආ)වැනි කොටසේ පළකරන නිවේදනයේ ප්‍රකාශයට පත්කරන ලද්දාවූ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව තීරණ අංක 219 යටතේ 2015-12-30 වැනි දින ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව මගින් ගන්නා ලද තීරණයට අනුව 2016 මාර්තු මස 11 වැනි දින අංක 1958 දරණ ගැසට් පත්‍රය මගින් ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ක්‍රියාත්මක කිරීමට බල ගන්වා ඇත. ඉහත කී අතුරු ව්‍යවස්ථාවේ 07 වන වගන්තියේ අංක (IV)සහ (V) උප වගන්ති වලින් පැවරී ඇති බලතල අනුව ඉහත දැක්වෙන උප ලේඛනය පරිදි ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ව්‍යාපාරික ස්ථාන වලින් සහ අපද්‍රව්‍ය බැහැර කරනු ලබන ස්ථාන වලින් 2023 වර්ෂය සඳහා ගාස්තු අය කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා. මේ පිළිබඳව අදහස් දැක්වීමට අවස්ථාව ලබා දෙනවා.

<u>ගරු සභාපතිතුමා</u>

වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව හා විරුද්ධත්වයක් නොමැති බව පෙනීයනවා.

තීරණය

ඒ අනුව 2023 වර්ෂය සඳහා ඝන අපද්‍රව්‍ය බැහැර කරනු ලබන ස්ථාන සඳහා ගාස්තු පැනවීම ඉහත උප ලේඛනයේ ආකාරයට සිදුකිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05:01:02 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

2023 වර්ෂය සඳහා සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා ගරු මහා සභාවට යෝජනා කරමි.

2023 වර්ෂය වෙනුවෙන් පහත සඳහන් සැපයුම් සහ සේවා සැපයීමට සැපයුම්කරුවන් වශයෙන් පහත නිර්ණායක යටතේ ලියාපදිංචි කරගැනීම පිණිස නිෂ්පාදකයන්ගෙන්, ලියාපදිංචි ආයතන වලින් සහ පුද්ගලයින්ගෙන් 2022.12.15 දින දක්වා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01 (අ)සැපයුම්

01 ඉදිකිරීම් ද්‍රව්‍ය සැපයුම්කරුවන්

02 විදුලි උපකරණ හා උපාංග

03 ඉලෙක්ට්‍රොනික් උපකරණ හා උපාංග

04 කාර්යාලීය භාණ්ඩ හා උපකරණ (දැව හා වානේ)

05 කාර්යාලීය ලිපිද්‍රව්‍ය

06 ජලනල හා උපාංග

07 සනිපාරක්ෂක උපකරණ හා උපාංග

08 වාහන අලූත්වැඩියා කිරීම - (රජයේ ලියාපදිංචි වී ඇති)

09 වාහන පින්තාරු කිරීම හා ටින්කරිං

10 වාහන සේවා කිරීම / වාහන කුලියට ලබා ගැනීම

11 ත්‍රිවීලර් අලුත්වැඩියා / නවීකරණය කිරීම

12 බයිසිකල් අලුත්වැඩියා කිරීම/ සේවා කිරීම

13 බීටුමන්, ඉමල්ෂන් සැපයුම්කරුවන්

14 ඉදිකිරීම් උපකරණ හා වාහන හා යන්ත්‍ර සූත්‍ර සැපයීම

15 පෙර නිමවුම් කොන්ක්‍රීට් නල, ඉන්ටර්ලොග් ගල්, උද්‍යාන අලංකරණ උපකරණ, බෝක්කු නල

16 නිල රෙදි වර්ග හා තිර රෙදි

17 මුද්‍රණ කටයුතු සඳහා ඩිජිටල් / ආකෘතිපත් / පොත් මුද්‍රණය

18 නාමපුවරු හා දැන්වීම් සැකසුම්කරුවන්

19 දැව වර්ග සැපයුම්කරුවන්

20 තීන්ත වර්ග

21 රබර් ආශ්‍රිත නිෂ්පාදන (ටයර්, ටියුබ්, කාපට්)

22 ලිහිසි ද්‍රව්‍ය

23 මිනුම් උපකරණ

24 ඉඩම් හා ගොඩනැගිලි මිනුම් කිරීම

25 කොහු බත් සැපයීම

26 ගොඩනැගිලි ද්‍රව්‍ය

27 විෂබීජ නාශක (සැනිටයිසර්)

28 මුව සහ මුහුණු ආවරණ, විෂබීජ හරණය සඳහා භාවිතා කරන ඇඳුම්

29 කාබනික පොහොර ඇසුරුම් මලු

02 (ආ)සේවාවන්

30.යතුරු ලියන, රෝනියෝ යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර ඇතුලු කාර්යාල උපකරණ අලුත්වැඩියා කිරීම

31 පරිගණක යන්ත්‍ර සහ මුද්‍රණ යන්ත්‍ර සේවාකිරීම හා අලුත්වැඩියා කිරීම

32 ක්‍රීඩා උපකරණ අලුත්වැඩියා කිරීම

භාණ්ඩ සැපයීමේ නිර්ණායක

01 උසස් තත්ත්වයේ වෙළඳ නාම සහිත භාණ්ඩ පමණක් සැපයීම

02 මිල උච්ඡාවචනය වීම අනුව සපයනු ලබන භාණ්ඩවල මිල වෙනස් නොකිරීම

03 නිසි කාලය තුළ නියමිත වේලාවට භාණ්ඩ සැපයීම.

04 භාණ්ඩ හා සේවා සඳහා චෙක්පත් වලින් පමණක් ගෙවීම් කිරීමට එකඟ විය යුතුයි

05 ඇනවුමට අදාල වෙළඳනාම සහිත භාණ්ඩ පමණක් සැපයීම

01 සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ කොන්දේසි

01 ලියාපදිංචි සැපයුම්කරුවන්ට අමතරව අවශ්‍ය අවස්ථාවලදී වෙනත් මිල ගණන් කැඳවා භාණ්ඩ මිල දී ගැනීමේ බලය මෙම සභාවට ඇත.

02 ඔබගේ විස්තර ඇතුළත් අයදුම්පතක් සහ ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක් ඉදිරිපත් කළයුතුයි.

03 එක් එක් අයිතමයක් වෙනුවෙන් රු 2500.00 ක ගාස්තුවක් ගෙවා ලියාපදිංචි විය යුතුයි.

04 භාණ්ඩ සැපයූ දින සිට අඩුම වශයෙන් දින 45 ක ණය පහසුකම් සැපයුම්කරුවන් විසින් ලබා දියයුතුය.

05 සැපයුම්කරුවන්ට අත්තිකාරම් මුදල් ගෙවනු නොලැබේ.

06 ලියාපදිංචි ගාස්තු චෙක්පත මගින් ගෙවීම් කරන්නේනම් ලේකම් ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව නමින් එවිය යුතුයි

02 කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම

ෂිඩා ආයතනයේ ලියාපදිංචි (ප්‍රදේශ හා දිපව්‍යාප්ත)

ප්‍රදේශයේ සමිති හා පුද්ගලයින් කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම

01 ව්‍යාපාර ලියාපදිංචිය හා හැකියාව තහවුරු කිරීම (ප්‍රාදේශීය ලේකම් කාර්යාලය)

02 පසුගිය වසර 03 ක සිදුකළ කොන්ත්‍රාත් පිළිබඳ විස්තර

03 සේවක හා උපකරණ පිළිබඳ තොරතුරු

03 කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමේ කොන්දේසි

01 කොන්ත්‍රාත් කිරීමට හැකියාව ඇති බවට වත්කම් ප්‍රකාශය

02 ලියාපදිංචි සමිති කොන්ත්‍රාත් කිරීමට හැකියාව ඇති බවට අදාල මුල්‍ය ප්‍රකාශන වාර්තා අදාළ ආයතන ප්‍රධානියාගේ සහතිකය සමඟ ඉදිරිපත් කළයුතුයි

03 කොන්ත්‍රාත්කරුවන් හා සමිති රු 3000.00ක් ගෙවා ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි විය යුතුයි

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. පී. ප්‍රසන්න විමල් මනතුංග මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

2023 වර්ෂය වෙනුවෙන් පහත සඳහන් සැපයුම් සහ සේවා සැපයීමට සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ඉහත නිර්ණායක යටතේ ලියාපදිංචි කරගැනීම පිණිස නිෂ්පාදකයන්ගෙන්, ලියාපදිංචි ආයතන වලින් සහ පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු මහා සභාවට මම යෝජනා කරනවා.

ගරු සභාපතිතුමා

වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව හා විරුද්ධත්වයක් නොමැති බව පෙනී යනවා.

තීරණය

ඒ අනුව 2023 වර්ෂය සඳහා සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05:01:03 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

2022 වර්ෂයේ අයවැය මගින් වෙන්කර ඇති ඇතැම් වැය විෂයන්වල ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන හෙයින් ප්‍රතිපාදන ඉතිරි වී ඇති වැය ශීර්ෂයන් වලින් ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා වීරමොං ක්‍රියාපටිපාටිය අනුගමනය කරමින් වැය ශීර්ෂ මාරු කිරීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

| ප්‍රතිපාදන අවශ්‍ය වැය ශීර්ෂය | විස්තරය | 2022 වර්ෂයේ වෙන් කර ඇති මුදල (රු) | අවශ්‍ය මුදල (රු) | මාරු කරන වැය ශීර්ෂය | විස්තරය | මුදල (රු) |
|---|---|---|---|---|---|---|
| 104-2 | කැබ් රථ/ත්‍රීරෝද රථ අලුත්වැඩියා කිරීම | 500,000.00 | 300,000.00 | 101-3 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 300,000.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 103-2 | ඉන්ධන (කැබ් රථ 02 ) | 700,000.00 | 700,000.00 | 105-8<br>304-3<br>307-4<br>604-1 | නීතිඥ ගාස්තු<br>නඩත්තු ඒකකයේ යන්ත්‍ර<br>අළුත්වැඩියා කිරීම හා<br>නඩත්තුව<br>හදිසි ආපදා - විෂය භාර<br>ඇමතිතුමාගේ<br>අනුමැතියට යටත්ව<br>ගොඩනැගිලි, යන්ත්‍රසූත්‍ර<br>අලුත්වැඩියාව හා<br>නඩත්තුව | 100,000.00<br>300,000.00<br>150,000.00<br>150,000.00 |
| 105-7 | වාහන කුලියට ගැනීම | 25,000.00 | 15,000.00 | 205-5 | වාහන කුලියට ගැනීම | 15,000.00 |
| 105-9 | පුවත්පත් දැන්වීම්,<br>ප්‍රචාරක කටයුතු | 175.000.00 | 50,000.00 | 101-8 | භාෂා පරිවර්තන දීමනා<br>හා ප්‍රචාරක කටයුතු | 50,000.00 |
| 107-7 | විදුලි කාර්මික රක්ෂණය | 5,000.00 | 500.00 | 107-2 | කැබ් රථ/යතුරු<br>පැදි/ත්‍රීරෝද රථ<br>රක්ෂණය | 500.00 |
| 109- | ලී බඩු හා සවිකිරීම් | 75,000.00 | 45,000.00 | 109-3 | ප්‍රින්ටර් ලබා ගැනීම | 45,000.00 |
| 109-4 | පරිගණක හා උපාංග<br>ලබා ගැනීම | 200,000.00 | 125,000.00 | 105-16<br>105-17<br>202-1 | සේවක අභිප්‍රේරණය හා<br>සුභසාධනය<br>ප්‍රාදේශීය සභා වෙබ්<br>අඩවිය සකස් කිරීම හා<br>සේවා ගාස්තු<br>ගමන් වියදම් | 50,000.00<br>50,000.00<br>25,000.00 |
| 303-4 | ඉන්ධන (නඩත්තු<br>ඒකකයේ යන්ත්‍ර සඳහා) | 1,200,000.00 | 350,000.00 | 401-3<br>403-1<br>307-4<br>505-1<br>604-2<br>309-5 | අතිකාල හා නිවාඩු දින<br>වැටුප්<br>සැපයුම් හා උපකරණ<br>හදිසි ආපදා<br>රුක්රෝපණ වැඩසටහන්<br>ගොඩනැගිලි<br>අලුත්වැඩියාව හා<br>නඩත්තුව<br>වැඩ ඒකකය සඳහා<br>උපකරණ | 50,000.00<br>100,000.00<br>50,000.00<br>50,000.00<br>50,000.00<br>50,000.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 204-1 | කරත්ත,අත්ට්‍රැක්ටර්, ට්‍රැක්ටර් අලුත්වැඩියාව හා නඩත්තුව | 250,000.00 | 495,000.00 | 605-5<br>607-4<br>301-3<br>203-7 | ක්‍රීඩා උත්සව<br>ප්‍රජා මූල සංවිධාන හා ප්‍රජා මණ්ඩල සවිබල ගැන්වීම<br>අතිකාල හා නිවාඩු දින වැටුප්<br>ඉන්ධන සැපයුම් ( සෞඛ්‍ය වෛද්‍ය කාර්යාලය හා වෙනත්) | 150,000.00<br>100,000.00<br>100,000.00<br>145,000.00 |
| 302-1 | නිලධාරී ගමන් වියදම් | 50,000.00 | 25,000.00 | 102-1 | ගමන් වියදම් | 25,000.00 |
| 203-2 | ඉන්ධන (ට්‍රැක්ටර්/ කසළ කපන යන්ත්‍රය) | 700,000.00 | 395,000.00 | 302-2<br>105-16<br>103-6 | පරිවර්තිත ගමන් වියදම් සේවක අභිප්‍රේරණය<br>වරිපනම් අංක තහඩු කිරීම | 220,000.00<br>25,000.00<br>150,000.00 |
| 605-4 | ජල බිල් ( ක්‍රීඩා පිටි/ කාය වර්ධන මධ්‍යස්ථානය) | 30,000.00 | 20,000.00 | 505-3 | වෙනත් දැනුවත් කිරීමේ වැඩසටහන් | 20,000.00 |
| | | | 2,520,500.00 | | | 2,520,500.00 |

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය පට්ටිපොල සුමනරතන හිමි

**එම යෝජනාව මම ස්ථිර කරනවා.**

**පෙ.ව.10.05ට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ආර්.පී.ගුණරත්න මහතා සභා ගර්භයට පැමිණියේය.**

ගරු සභාපතිතුමා

**කැබ් රථ/ත්‍රීරෝද රථ අලුත්වැඩියා කිරීම, ඉන්ධන(කැබ් රථ 02), වාහන කුලියට ගැනීම, පුවත්පත් දැන්වීම්, ප්‍රචාරක කටයුතු, විදුලි කාර්මික රක්ෂණය, ලී බඩු හා සවිකිරීම්, පරිගණක හා උපාංග ලබා ගැනීම, ඉන්ධන (නඩත්තු ඒකකයේ යන්ත්‍ර සඳහා), කරත්ත, අත්ට්‍රැක්ටර්, ට්‍රැක්ටර් අලුත්වැඩියාව හා නඩත්තුව, නිලධාරී ගමන් වියදම්, ඉන්ධන (ට්‍රැක්ටර්/ කසළ කපන යන්ත්‍රය), ජල බිල් ( ක්‍රීඩා පිටි/ කාය වර්ධන මධ්‍යස්ථානය) යන වැය ශීර්ෂ සඳහා රුඃ 2,520,500.00ක මුදලක් අවශ්‍ය වී ඇති බැවින් ඉහත සඳහන් කළ වැය ශීර්ෂවල ඉතිරිව ඇති ප්‍රතිපාදන විරමොං ක්‍රියාපටිපාටිය අනුගමනය කරමින් එකී වැය ශීර්ෂවලට මාරු කිරීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා. මේ පිළිබඳව අදහස් ඇත්නම් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනවා.**

තීරණය

2022 වර්ෂයේ අයවැය මගින් වෙන්කර ඇති ඇතැම් වැය විෂයන්වල ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන හෙයින් ප්‍රතිපාදන ඉතිරි වී ඇති වැය ශීර්ෂයන් වලින් ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා වීරමොං ක්‍රියාපටිපාටිය අනුගමනය කරමින් වැය ශීර්ෂ මාරු කිරීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු මහා සභාවට තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05:01:04 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

ඇත්ගාල ප්‍රදේශයේ අනවසර ඉදිකිරීමක් කඩා ඉවත්කිරීම සම්බන්ධ M 5795/08 නඩුව වෙනුවෙන් වන්දි ගෙවීම සම්බන්ධයෙන් සිදු කරනු ලැබූ මු.රෙ. 104(4) පරීක්ෂණයේ අවසන් වාර්තාව 2016.11.23 වන දින ලබා දුන් අතර ඒ අනුව පරීක්ෂණයට අදාළ පාර්ශවයන් විසින් එම පරීක්ෂණයේ අවසන් වාර්තාව පිළිගත නොහැකි බව පවසමින් අභියාචනා සිදු කරන ලද අතර එම අභියාචනා සළකා බැලීම සඳහා සිදු කරනු ලැබූ පරීක්ෂණයේ වාර්තාව මේ වන විට සභාවට ලැබී ඇත. ඒ අනුව පහත නම් සඳහන් අයගෙන් පහත සඳහන් පරිදි වන්දි මුදල් අය කරගන්නා ලෙස දන්වා ඇති අතර එම වන්දි මුදල් කඩිනමින් සභාව වෙත අයකර ගැනීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

- සිසිර අලුත්ගමගේ මහතා රු. 509610.00
- ඒ. මහින්දරත්න අලුත්ගමගේ මහතා රු. 448456.80
- එම්.බී. කරල්ලියද්ද මහතා රු. 50961.00
- එන්.එම්. උදයශාන්ත නවරත්න මහතා රු. 10192.20

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ. සුමේධ අලුත්ගමගේ මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

ගරු උපසභාපතිතුමා ගරු සභාපති වශයෙන් කටයුතු කරන ලද ධුර කාලයේදී ඉහත නඩුවට අදාළ නිලධාරීන් පෙනී නොසිටීම හේතුවෙන් එම නඩුව ඒකපාර්ශවිකව විභාග වීම නිසා මෙම නඩු තීන්දුව ලැබුණු බැවින් අදාළ තීන්දුව නැවත සළකා බලන ලෙස කරන ලද ඉල්ලීම අනුව අය කිරීමට තීන්දු කරන ලද අලාභ මුදල් ප්‍රමාණයන් අඩු වී

තිබෙනවා. ඒ අනුව සිසිර අලුත්ගමගේ මහතාගෙන් රු.509610.0ක්ද ඒ. මහින්දරත්න අලුත්ගමගේ මහතාගෙන් රු. 448,456.80ක්ද එම්.බී. කරල්ලියද්ද මහතාගෙන් රු. 50961..00ක් සහ එන්.එම්. උදයශාන්ත නවරත්න මහතාගෙන් රු.10192..20ක් යනාදී වශයෙන් අයකරගන්නා ලෙස දන්වා තිබෙනවා. ඒ අනුව එම වන්දි මුදල් කඩිනමින් සභාව වෙත අයකර ගැනීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා. මේ පිළිබඳව අදහස් දැක්වීමට අවස්ථාව ලබා දෙනවා.

ගරු සභාපතිතුමා

මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව හා විරුද්ධත්වයක් නොමැති බව පෙනී යනවා.

තීරණය

ඇත්ගාල ප්‍රදේශයේ අනවසර ඉදිකිරීමක් කඩා ඉවත් කිරීම සම්බන්ධ M 5795/08 නඩුවේ අභියාචනා සළකාබැලීම සඳහා සිදුකරනු ලැබූ පරීක්ෂණයේ වාර්තාව අනුව සිසිර අලුත්ගමගේ මහතාගෙන් රු.509,610.00ක්ද ඒ.මහින්දරත්න අලුත්ගමගේ මහතාගෙන් රු.448,456.80ක්ද එම්.බී. කරල්ලියද්ද මහතාගෙන් රු. 50,961..00ක් සහ එන්.එම්. උදයශාන්ත නවරත්න මහතාගෙන් රු.10,192.20ක් යනාදී වශයෙන් අදාළ වන්දි මුදල් කඩිනමින් සභාව වෙත අයකර ගැනීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05:01:05 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

ආදායම් පරීක්ෂකවරයා විසින් සිදුකළ ස්ථානීය පරීක්ෂණයකින් පසුව තහවුරු කරගත් අයිතිකරුවන් හඳුනා ගැනීමේ අපහසුව හා මායිම් හඳුනා ගැනීමේ අපහසුව නිසා දැනට බිල් කිරීම නවතා දමා ඇති වරිපනම් ලේඛනයේ හිඟ ශේෂ පවතින කුඹුරු ඉඩම්වල මේ දක්වා ඇති සම්පූර්ණ හිඟ මුදල වන රු.267,608.10 ක මුදල ලේඛන වලින් ඉවත් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ. සුමේධ අලුත්ගමගේ මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

පෙ.ව.10.05ට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී රාජ්කුමාර් විදුෂණි මහත්මිය සභා ගර්භයට පැමිණියාය.

ගරු සභාපතිතුමා

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අර්ථකථනය කර ඇති ආකාරය අනුව වරිපනම් බදු අයකළ හැකි දේපළ ලෙස දක්වා ඇත්තේ ගෙයක්, ගොඩනැගිල්ලක්, ඉඩමක් හෝ ගෙපතක් යනාදියයි. ඒ අනුව ආදායම් පරීක්ෂක මහතා විසින් පෙන්වා දි ඇති පරිදි කුඹුරු ඉඩම් යන්න එහි අර්ථකථනය කර නැත. එසේම එය මු. රෙ. 102(2) සහ මු.රෙ. 113 ප්‍රකාරව අත්හැර දැමිය හැකියි. කුඹුරු ඉඩම්වලින් වරිපනම් අය කිරීමේ හැකියාවක් නැති නිසා 2019 වර්ෂයේ සිදුකළ තක්සේරුවෙන් 2020 වර්ෂයේ සිට කුඹුරු ඉඩම් බිල් කිරීම තක්සේරු දෙපාර්තමේන්තුව විසින් නවතා තිබෙනවා. දැනට අයකළ හැකිව තිබූ හිඟ ශේෂ සභාව වෙත අයකරගෙන තිබෙන අතර ආදායම් පරීක්ෂකවරයා විසින් සිදුකළ ස්ථානීය පරීක්ෂණයකින් පසුව තහවුරු කරගත් අයිතිකරුවන් හඳුනා ගැනීමේ අපහසුව හා මායිම් හඳුනා ගැනීමේ අපහසුව නිසා අයකරගත නොහැකිව පවතින සහ දැනට බිල් කිරීම නවතා දමා ඇති කුඹුරු ඉඩම් ලේඛනය සභාව වෙත ඉදිරිපත් කර තිබෙනවා. ඒ අනුව වරිපනම් ලේඛනයේ හිඟ ශේෂ පවතින කුඹුරු ඉඩම්වල මේ දක්වා ඇති සම්පූර්ණ හිඟ මුදල වන රු.267,608.10 ක මුදල ලේඛන වලින් ඉවත් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරනවා.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ආර්.පී.ගුණරත්න මහතා විසින් යෝජනා කර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.ඩබ්. පතිරණ මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව මහා සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී.ගුණරත්න මහතා විසින් යෝජනා කර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී.ප්‍රසන්න විමල් මනතුංග මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව කාරක සභාව මහා සභාවක් බවට පත් කරන ලදී.

ගරු සභාපතිතුමා

මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව හා විරුද්ධත්වයක් නොමැති බව පෙනී යනවා.

තීරණය

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අර්ථකථනය කර ඇති ආකාරය අනුව වරිපනම් අයකළ හැකි දේපළ ලෙස දක්වා ඇත්තේ ගෙයක්, ගොඩනැගිල්ලක්, ඉඩමක් හෝ ගෙපතක් යනාදිය වන අතර ඒ අනුව ආදායම් පරීක්ෂක විසින් පෙන්වා දි ඇති පරිදි කුඹුරු ඉඩම් යන්න එහි අර්ථකථනය කර නොමැති බැවින්ද මු. රෙ. 102(2) සහ මු.රෙ. 113 ප්‍රකාරව අත්හැර දැමිය හැකි බැවින් ද වරිපනම් ලේඛනයේ හිඟ ශේෂ පවතින කුඹුරු ඉඩම්වල මේ දක්වා ඇති සම්පූර්ණ හිඟ මුදල වන රු.267,608.10 ක මුදල වරිපනම් ලේඛන වලින් ඉවත් කිරීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05:01:06 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන - 2021 යටතේ ක්‍රියාත්මක කරන ලද ශ්‍රීධරන්පුර ජල යෝජනා ක්‍රමය සඳහා රුපියල් 2,919,595.38 ක මුදලක් සභාව වෙත ලැබී ඇති අතර එම මුදල් අදාළ කොන්ත්‍රාත් ආයතනය වන චීෆ් ඉංජිනියරින් ආයතනය (CHIEF ENGINEERING) වෙත ගෙවීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.ජී.ඩබ්.පී.පී. ගුරුගේ මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන - 2021 යටතේ ක්‍රියාත්මක කරන ලද ශ්‍රීධරන්පුර ජල යෝජනා ක්‍රමය සඳහා රු:2,919,595.38ක මුදලක් සභාව වෙත ලැබී ඇති අතර එම මුදල් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද කොන්ත්‍රාත් ආයතනය වන චීෆ් ඉංජිනියරින් (CHIEF ENGINEERING) වෙත ගෙවීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරනවා. ගෙවීම් ප්‍රමාද වනවිට සවිකර තිබෙන මෝටර්වල වගකීම් කාලසීමාව අවසන් විය හැකියි. මුදල් ගෙවනතුරු කොන්ත්‍රාත්කරු ව්‍යාපෘතිය භාර නොදෙන නිසා හැකි ඉක්මණින් ගෙවීම් සිදුකිරීම සුදුසුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.ජී.ඩබ්.පී.පී. ගුරුගේ මහතා

ගරු සභාපතිතුමනි, මෙම කොන්ත්‍රාත්තුව අවසන් කර බිල්පත් ඉදිරිපත් කර ඇති නමුත් තවම ගෙවීම් සිදුකර නැහැ. මෙම ව්‍යාපාතිය කොන්ත්‍රාත්කරුවන් තිදෙනෙක් එම මුදලට කළ නොහැකියි කියූ ව්‍යාපෘතියක් වන අතර මේ සඳහා එකඟ වුයේ මෙම කොන්ත්‍රාත්කරු පමණයි. එම නිසා තාක්ෂණ නිලධාරී නිර්දේශය මත ඉතා ඉක්මනින් ගෙවීම් කටයුතු සිදුකළ යුතුබව මගේ අදහසයි. දැනට ජලය ටැංකි වලින් බෙදාහැරීම සඳහා බට සම්බන්ධ කිරීමට පමණක් ඉතිරිව තිබෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී. ගුණරත්න මහතා

ගරු සභාපතිතුමනි, ඇස්තමේන්තුවට අදාළව සිදු කළයුතු වැඩ කොටස අවසන් නම් තාක්ෂණ නිලධාරී නිර්දේශය මත ගෙවීම් කටයුතු සිදුකිරීම සුදුසුයි.

ගරු සභාපතිතුමා

මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව හා විරුද්ධත්වයක් නොමැති බව පෙනී යනවා.

තීරණය

පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන - 2021 යටතේ ක්‍රියාත්මක කරන ලද ශ්‍රීධරන්පුර ජල යෝජනා ක්‍රමය සඳහා සභාව වෙත ලැබී ඇති රුපියල් 2,919,595.38 ක මුදල තාක්ෂණ නිලධාරී නිර්දේශය අනුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලද කොන්ත්‍රාත් ආයතනය වන චීෆ් ඉංජිනියරින් ආයතනය (CHIEF ENGINEERING) වෙත ගෙවීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05:01:07 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

දැනට රාක්ෂාව වසමේ පිහිටා ඇති සමෘද්ධි බැංකු ගොඩනැගිල්ල සේවාලාභීන්ගේ පහසුව සළකා මැදගොඩ හන්දියේ ඉදිකිරීමට අපේක්ෂා කරන බැවින් ඒ සඳහා මැදගොඩ හන්දිය අසළ ප්‍රාදේශීය සභාවට අයත් ඉඩම් කොටසක් ලබා දෙන ලෙස ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව සමෘද්ධි බැංකු ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා මැදගොඩ හන්දිය අසළ ප්‍රාදේශීය සභාවට අයත් ඉඩම් කොටසක් ලබා දීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.ඩබ්. පතිරණ මහතා

මම එම යෝජනාව ස්ථිර කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.පී. කොල්වින් සිල්වා මහතා

ගරු සභාපතිතුමනි, රාක්ෂාව වසමේ පිහිටා ඇති සමෘද්ධි බැංකුව මාස කිහිපයකට පෙර පූර්ව දැනුම්දීමකින් තොරව මැදගොඩ හන්දියට රැගෙන එනු ලැබුවා. 1996 වර්ෂයේදී වසම් එකොළහක ජනතාවට සේවා සැපයීම සඳහා ස්ථාපිත කරන ලද මෙම සමෘද්ධි බැංකුව 2000ක පමණ සේවාලාභීන් සංඛ්‍යාවකට සේවා සපයනු ලබයි. බලප්‍රදේශයේ දුෂ්කරම

වසම වන කෙලිගෲප් සිට මැදගොඩ හන්දිය දක්වා ජනතාව සේවා ලබාගැනීමට පැමිණීමේදී තලපාල සිට දොළොස්බාගේ දක්වා කිලෝමීටර් 14ක් සහ දොළොස්බාගේ සිට මැදගොඩ හන්දියේ දක්වා කිලෝමීටර් 14ක් වශයෙන් මුළු දුර කිලෝමීටර් 28ක් ගෙවා පැමිණිය යුතුයි. නමුත් මේ වසම් 13 ගත්විට ආසන්නව පිහිටා තිබෙන වසම් වන කෙලිගෲප්, මියනගොල්ල, පට්තලාව, අළුගොල්ල, රාක්ෂාව, පිටකන්ද වසමේ කොටසක් මෙම සමෘද්ධි බැංකුව රාක්ෂාවේ පිහිටා තිබීම නිසා ඉතා පහසුවෙන් සේවාවන් ලබාගනු ලැබුවා. වසර ගණනාවක් පුරා මාගේ ගමේ තිබුණු එකම රාජ්‍ය ආයතනය වු මෙම සමෘද්ධි බැංකුව මෙලෙස වෙනත් ස්ථානයක ස්ථාපිත කිරීම මා තුළ සහ මගේ ගමේ ජනතාව තුළ විශාල වේදනාවක් ඇති කළා. සාමාජිකයන්ගේ ඉල්ලීමක් මත මෙය සිදුවූවා නම් ගැටළුවක් නැහැ. නමුත් මෙය නිලධාරීන්ගේ ඉල්ලීමක් මත සිදුවූවක්. සමෘද්ධි බැංකු ගොඩනැගිල්ල සියලු පහසුකම් සහිත රජයේ ගොඩනැගිල්ලක් වුවත් දැනට මැදගොඩ හන්දියේ පිහිටා ඇති ගොඩනැගිල්ල මාසිකව රු.50,000.00ක කුලී පදනම මත පවත්වාගෙන යනු ලබයි. රාක්ෂාවේ පිහිටා තිබූ සමෘද්ධි බැංකුව මැදගොඩ හන්දියේ ස්ථාපිත කිරීමේ තීරණය සම්බන්ධයෙන් මම විරුද්ධත්වය ප්‍රකාශ කරනවා. මේ සම්බන්ධයෙන් මම හිටපු අමාත්‍ය ගරු මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා සහ ප්‍රාදේශීය ලේකම්තුමිය දැනුවත් කර තිබෙනවා. වසම් දහතුනෙන් පහකට එනම්, යටපාන, උඩුවැල්ල, වැටකේදෙණිය, ගැමුණුපුර, උඩහේන්තැන්න වසම්වලට සමෘද්ධි බැංකුව රාක්ෂාවේ පිහිටා තිබීම නිසා පහසු වුවත් එම වසම් හතරට කිලෝමීටර් තුනක් පමණ ආසන්නව කුරුඳුවත්ත සමෘද්ධි බැංකුව පිහිටා තිබෙනවා. ඒ වසම්වල ජනතාව කුරුඳුවත්ත සමෘද්ධි බැංකුවට සම්බන්ධ කර අනෙක් වසම් සඳහා සමෘද්ධි බැංකුව රාක්ෂාවේම ස්ථාපිත කිරීම සුදුසු බව මගේ අදහසයි.

<u>ගරු සභාපතිතුමා</u>

ගරු මන්ත්‍රීතුමනි, වසම් වැඩි ප්‍රමාණයක කැමැත්ත වුයේ සමෘද්ධි බැංකුව මැදගොඩ හන්දියේ ස්ථාපිත කිරීමටයි. නමුත් හිටපු අමාත්‍ය ගරු මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමාගේ මතයත් මෙය රාක්ෂාවේම පැවතිය යුතු බවයි. එම නිසා සමෘද්ධි බැංකුව මැදගොඩ හන්දියේ ස්ථාපිත කිරීමේ තීරණය සම්බන්ධයෙන් නැවත සළකා බලන ලෙස ඉල්ලීම් කිරීම සුදුසු බව මගේ ද අදහසයි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී.ප්‍රසන්න විමල් මනතුංග මහතා</u>

ගරු සභාපතිතුමනි, වර්තමානයේ ජනතාවගේ පහසුව සඳහා රාජ්‍ය ආයතන නගරයෙන් ගමට ව්‍යාප්ත වෙනවා මිස ගමෙන් නගරයට ව්‍යාප්ත වීමක් සිදුවන්නේ නැහැ. තලපාල, කෙලිගෲප් වැනි දුෂ්කර ගම්වල සිට රු.200.00ක් වියදම් කරගෙන මැදගොඩ හන්දියට පැමිණීමට සිදුවෙනවා. උඩුවැල්ල, යටපාන, ගැමුණුපුර, වැටකේදෙණිය ජනතාව කුරුඳුවත්ත සමෘද්ධි බැංකුවට යොමුකර දොළොස්බාගේ, රාක්ෂාව, අළුගොල්ල, කෙලිගෲප් වසම් සඳහා සමෘද්ධි බැංකුව රාක්ෂාවේ ම ස්ථාපිත කිරීම සුදුසු බව මගේ අදහසයි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය පට්ටිපොල සුමනරතන හිමි</u>

ගරු සභාපතිතුමනි, මේ බැංකුව මැදගොඩ හන්දියට ගෙන ඒම සම්බන්ධයෙන් මගේ විරුද්ධත්වය ප්‍රකාශ කරනවා. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කොල්වින් සිල්වා මහතා ප්‍රකාශ කළ කරුණුවලට අමතරව මමත් යමක් ප්‍රකාශ කළ යුතුයි. මීට වසර ගණණාවකට පෙර දොළොස්බාගේ තිබූ මහජන බැංකුව කුරුඳුවත්ත නගරයට ගෙනගිය අතර දිසා රෝහල ප්‍රාදේශීය රෝහලක් බවටත් තැපැල් කාර්යාලය උප තැපැල් කාර්යාලයක් බවටත් පත්කර තිබෙනවා. නිලධාරීන්ගේ උවමනාවට හෝ මාර්ගය පුළුල් කිරීම සඳහා හෝ මෙම බැංකුව මැදගොඩ හන්දියට ගෙනයාම නුසුදුසු බව මගේ අදහසයි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ඩබ්.නාලක වසන්ත අබේසේකර මහතා</u>

ගරු සභාපතිතුමනි, මගේ අදහස නම් බැංකුව මැදගොඩ හන්දියේ ස්ථාපිත කිරීම සුදුසු බවයි. ඊට හේතුව වන්නේ උඩුවැල්ල, යටපාන ජනතාවත් සමෘද්ධි බැංකුවේ සේවා ලබා ගැනීම සඳහා පරගලට යායුතු අතර වැටකේදෙණිය සිට පරගල දක්වා විශාල දුරක් ගෙවා යායුතුයි. එහිදී බස් රථ ධාවනය වන්නේ ගමන්වාර දෙකක් පමණක් නිසා පැය දෙක තුනක් මැදගොඩ හන්දියේ ගත කිරීමට ඔවුන්ට සිදුවෙනවා. කාර්යලයක් ස්ථාපිත කිරීමේදී ප්‍රවාහන පහසුකම්, සේවාදායනයන්ට ළඟාවිය හැකි ආකාරයේ අතරමැදි ස්ථානයක පිහිටීම යනාදී කරුණු සළකා බලනවා. උඩුවැල්ල, යටපාන, ගැමුණුපුර, වැටකේදෙණිය වසම් කුරුඳුවත්ත ශාඛාවට යොමු කිරීම සුදුසු බව මගේ අදහසයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී. සරත් කුමාර ලාල් මහතා

ගරු සභාපතිතුමනි, කුරුදුවත්ත බැංකු ශාඛාවට තවත් වසම් කිහිපයක් යොමු කිරීම නිසා දැනටත් විශාල පෝලිමක් පවතින එම බැංකුවේ පෝලිම තවදුරටත් වැඩිවිය හැකියි. ජනතාව තවත් අපහසුතාවයට පත්විය හැකියි. කෙලිගෑප් වසම තරමට වැටකේදෙණිය, යටපාන වසම් දුෂ්කර නොමැති නිසාත් කුළී පදනම මත රාජ්‍ය ආයතනයක් පවත්වාගෙන යාම මෙම කාලවකවානුව තුළ අනුමත කළ නොහැකි නිසාත් ජනතා ඉල්ලීමක් නොමැති නම් වසර විස්සක් පුරා පවත්වාගෙන ගිය රාක්ෂාව සමෘද්ධි බැංකුව එලෙසින්ම පවත්වා ගෙනයාම සුදුසු වේ යන්න මාගේ අදහසයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.ඩබ්. පතිරණ මහතා

ගරු සභාපතිතුමනි, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කොල්වින් සිල්වා මහතා ඉදිරිපත් කළ අදහසට ප්‍රතිවිරුද්ධ අදහසක් ඉදිරිපත් කිරීමට සිදුවීම පිළිබඳව කණගාටුයි. එතුමාගේ ප්‍රකාශය අනුව අදාළ ප්‍රාදේශීය දේශපාලන නායකයින් දැනුවත් කිරීමෙන් තොරව නිලධාරී මට්ටමින් තීරණ ගැනීම දෝෂ සහගතයි. බෙරවිල, පටිතලාව, උඩුවැල්ල, යටපාන, ගැමුණුපුර, වැටකේදෙණිය වසම්වල සමෘද්ධිලාභීන්ට වඩා සුදුසු සහ වඩාත් ප්‍රායෝගික වන්නේ බැංකුව මැදගොඩ හන්දියේ පිහිටා තිබීමයි. විශේෂයෙන් තලපාල සිට රාක්ෂාව දක්වා පැමිණීමත් බෙරවිල සිට රාක්ෂාවට ගමන් කිරීමත් අසීරුයි. බස් රථයක් මගහැරුණු විට විශාල කාලයක් නිකරුණේ ගෙවා දමන්නට සිදුවෙනවා. එම නිසා එකී වසම් සඳහා සමෘද්ධි බැංකුවක් මැදගොඩ හන්දියේ පිහිටුවා රාක්ෂාවේ පෙර පැවති පරිදි සමෘද්ධි බැංකුව පවත්වා ගෙනයාමත් ප්‍රායෝගිකයි. මේ පිළිබඳව සාකච්ඡා කර තීරණයක් ගැනීම සුදුසුයි.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඒ. මහින්දරත්න අලුත්ගමගේ මහතා

ගරු සභාපතිතුමනි, මේ සම්බන්ධයෙන් හිටපු අමාත්‍ය ගරු මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා සමග සාකච්ඡා කරන අවස්ථාවේ මුලින්ම ඉදිරිපත් කරන ලද ගැටළුව වන්නේ නිලධාරීන්ගේ ප්‍රවාහන ගැටළුවයි. ජනතාවගේ පාර්ශවයෙන් ඉදිරිපත් කරන ලද යෝජනාවක් නොවන නිසා මෙම තීරණයට මම විරුද්ධයි. මේ සම්බන්ධයෙන් අදහස් දැක්වූ මන්ත්‍රීරුවන්ගේ අදහස් සියල්ල සත්‍යයි. වසර 26කට ඉහතදී රාක්ෂාවේ මෙම බැංකුව ස්ථාපිත කිරීමට හේතු වූයේ එය සුදුසු ස්ථානයක් වීම නිසයි. මේ පිළිබඳව සාධාරණව සාකච්ඡා කර තීරණයක් ගැනීම සුදුසු බව මාගේ ද අදහසයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී. ගුණරත්න මහතා

මූලාසනයේ ගරු සභාපතිතුමනි, කොල්වින් මන්ත්‍රීතුමා දේශපාලනික වශයෙන් ජනතාවගෙන් එල්ලවන දෝෂාරෝපණ හමුවේ ගැටළුවකට පත්ව ඇති බව පැහැදිලියි. නමුත් උපසභාපතිතුමා ප්‍රකාශ කළ ආකාරයට මෙම ස්ථානවල සමෘද්ධි බැංකු ස්ථාපිත කිරීමට ශක්තිය ලබාදුන්නේ හිටපු අමාත්‍ය ගරු මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමායි. මා දන්නා ආකාරයට ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී වසම් 31 ක් හා සමෘද්ධි ප්‍රතිලාභීන් නවදහසත් එකොළොස්දහසත් අතර සංඛ්‍යාවක් සිටින අතර මහා සංගම් 03 කට වසම් නවයත් එකොළහත් අතර සංඛ්‍යාවක් වෙන්කර තිබෙනවා. ඒ සම්බන්ධව පළාත් පාලන ආයතනවලට අතපෙවිය නොහැකියි. එම මහා සංගම් අදාළ චක්‍රලේඛවලට අනුකූලව සමෘද්ධි ප්‍රතිලාභීන් ප්‍රමාණය අනුව බෙදා වෙන්කර ඇත්නම් ඒ සම්බන්ධව සමෘද්ධි අධිකාරිය තීරණය ගතයුතුයි. ප්‍රාදේශීය ලේකම්තුමිය, සමෘද්ධි කළමනාකාරතුමා, ප්‍රාදේශීය මන්ත්‍රීවරුන් ඒකාබද්ධ කර සාකච්ඡා කර තීරණයක් ගැනීම සුදුසුයි.

ගරු සභාපතිතුමා

වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව පෙනී යනවා. සමෘද්ධි බැංකුව මැදගොඩ හන්දියේ ස්ථාපිත කිරීම සම්බන්ධව හිටපු අමාත්‍ය ගරු මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා, ප්‍රාදේශිය ලේකම්තුමිය, සමෘද්ධි කළමනාකාරතුමා, ප්‍රාදේශීය මන්ත්‍රීවරුන් එක්ව සාකච්ඡා කර තීරණයක් ගැනීම සුදුසුයි. ඒ අනුව ඉඩම ලබා දීම සම්බන්ධයෙන් තීරණයක් ගත හැකියි.

ගරු සභාපතිතුමා

මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව හා විරුද්ධත්වයක් නොමැති බව පෙනී යනවා.

තීරණය

සමෘද්ධි බැංකුව මැදගොඩ හන්දියේ ස්ථාපිත කිරීම සම්බන්ධව හිටපු අමාත්‍ය ගරු මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා, ප්‍රාදේශිය ලේකම්තුමිය, ප්‍රාදේශීය මන්ත්‍රීවරුන් හා නිලධාරීන් එක්ව සාකච්ඡා කර තීරණයක් ගැනීම සුදුසු බවත් ඒ අනුව ඉඩම ලබා දීම සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සුදුසු බවටත් ගරු මහා සභාව තීරණය කරන ලදී.

05:01:08 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

මධ්‍යම පළාත තුළ පිහිටි රජය සතු ඉඩම් සඳහා සිදුකර ගන්නා මැනුම් සඳහා ගෙවීම් කිරීමේදී ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන කමිටුවට ඉදිරිපත් කළ මිළ ගණන් අනුව මහනුවර දිස්ත්‍රික්කය සඳහා නම් ඉදිරිපත් කර ඇති මිනින්දෝරු ගයාසර ගිණිගේ මහතා යොදා ගැනිම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ. අජිත් ප්‍රියන්ත බණ්ඩාර මහතා

මම එම යෝජනාව ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

රජය සතු ඉඩම් මැනීම සඳහා මෙම ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන කමිටුවට ඉදිරිපත් කළ මිළ ගණන් අනුව මෙම මිනින්දෝරු මහතා තෝරාගෙන ඇති බව පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් අප වෙත දන්වා තිබෙනවා. තාක්ෂණ නිලධාරී මහතා විසින් අනෙක් මිනින්දෝරු මහත්වරු ඉදිරිපත් කළ මිළ ගණන් අනුව සමග සසඳන විට මෙම මිළ ගණන් සාධාරණ බවත් වාර්තා කොට තිබෙනවා. මේ පිළිබඳව ගරු මහා සභාවේ අදහස් ඉදිරිපත් කරන ලෙස යෝජනා කරනවා.

ගරු සභාපතිතුමා

මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව හා විරුද්ධත්වයක් නොමැති බව පෙනී යනවා.

තීරණය

මධ්‍යම පළාත තුළ පිහිටි රජය සතු ඉඩම් සඳහා සිදුකර ගන්නා මැනුම් සඳහා ගෙවීම් කිරීමේදී ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන කමිටුවට ඉදිරිපත් කළ මිළ ගණන් අනුව මහනුවර දිස්ත්‍රික්කය සඳහා නම් ඉදිරිපත් කර ඇති මිනින්දෝරු ගයාසර ගිණිගේ මහතා යොදා ගැනිම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05:01:09 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

2022-04-26 දින පැවති මහා සභාවේ තීරණ අංක 05:01:02 යටතේ මැනුම් කර ගැසට් කිරීම සඳහා සභා අනුමැතිය ලද ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවට අයත් මාර්ග 09ක් මැනුම් කිරීම අවසන් බැවින් වසර තුනක කාල සීමාවක්

ඇතුළත නීත්‍යනුකූලව ගැසට් කිරීම සඳහා ගරු විෂයභාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු

| අනු අංකය | මාර්ගයේ නම | දිග (කි.මී/මී) | පළල (අඩි) | පිඹුරුපත් අංකය |
|---|---|---|---|---|
| 01 | රජඇල අසල සිට ගම්පොලවෙල ප්‍රධාන පාරට සම්බන්ධ වන මහපුරණ පාර | 01Km | 12 | 3418 |
| 02 | ඇත්ගාල ප්‍රධාන පාර | 02km | 14 | 3417 |
| 03 | සිංහපුරගම මැද පාර | 750m | 10 | 3419 |
| 04 | වැටකේදෙණිය සිට උඩුවැල්ල දක්වා පාර | 3.5km | 10 | 3421 |
| 05 | යටපාන බුන්නාව හරහා තියඹරාමය දක්වා පාර | 750m | 10 | 3420 |
| 06 | පරගල බස්නැවතුම්පොල අසල සිට පරගල නව ජනපදය පාර | 2km | 10 | 3413 |
| 07 | කොලුවල වැලිහිරියේ සිට බටගොල්ල දක්වා පාර | 1.7km | 10 | 3416 |
| 08 | මීතලාව නාගහමුල හන්දියේ සිට ගිරාඋල්ල පන්සල හරහා ප්‍රධාන පාරට සම්බන්ධ වන අතුරු මාර්ගය | 1.5km | 10 | 3415 |
| 09 | අලුගොල්ලේ සිට රන්තැටියාවත්තට යන පාර | 1km | 10 | 3414 |

ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.සුමේධ අලුත්ගමගේ මහතා මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

2022-04-26 දින පැවති මහා සභාවේ තීරණ අංක 05:01:02 යටතේ මැනුම් කර ගැසට් කිරීම සඳහා සභා අනුමැතිය ලද ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවට අයත් රජඇල අසල සිට ගම්පොලවෙල ප්‍රධාන පාරට සම්බන්ධ වන මහපුරණ පාර, ඇත්ගාල ප්‍රධාන පාර, සිංහපුරගම මැද පාර, වැටකේදෙණිය සිට උඩුවැල්ල දක්වා පාර, යටපාන බුන්නාව හරහා තියඹරාමය දක්වා පාර, පරගල බස්නැවතුම්පොල අසල සිට පරගල නව ජනපදය පාර, කොලුවල වැලිහිරියේ සිට බටගොල්ල දක්වා පාර, මීතලාව නාගහමුල හන්දියේ සිට ගිරාඋල්ල පන්සල හරහා ප්‍රධාන පාරට සම්බන්ධ වන අතුරු මාර්ගය, අලුගොල්ලේ සිට රන්තැටියාවත්තට යන පාර යන මාර්ග මැනුම් කිරීම අවසන් බැවින් වසර තුනක කාල සීමාවක් ඇතුළත නීත්‍යනුකූලව ගැසට් කිරීම සඳහා ගරු විෂයභාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා.

ගරු සභාපතිතුමා

මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව හා විරුද්ධත්වයක් නොමැති බව පෙනී යනවා.

තීරණය

2022-04-26 දින පැවති මහා සභාවේ තීරණ අංක 05:01:02 යටතේ මැනුම් කර ගැසට් කිරීම සඳහා සභා අනුමැතිය ලද ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවට අයත් රජඇල අසල සිට ගම්පොලවෙල ප්‍රධාන පාරට සම්බන්ධ වන මහපුරණ පාර, ඇත්ගාල ප්‍රධාන පාර, සිංහපුරගම මැද පාර, වැටකේදෙණිය සිට උඩුවැල්ල දක්වා පාර, යටපාන බුන්නාව හරහා තියඹරාමය දක්වා පාර, පරගල බස්නැවතුම්පොල අසල සිට පරගල නව ජනපදය පාර, කොලුවල වැලිහිරියේ සිට බටගොල්ල දක්වා පාර, මීතලාව නාගහමුල හන්දියේ සිට ගිරාඋල්ල පන්සල හරහා ප්‍රධාන පාරට සම්බන්ධ වන අතුරු මාර්ගය, අලුගොල්ලේ සිට රන්තැටියාවත්තට යන පාර යන මාර්ග මැනුම් කිරීම අවසන් බැවින්

වසර තුනක කාල සීමාවක් ඇතුළත නීත්‍යනුකූලව ගැසට් කිරීම සඳහා ගරු විෂයභාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05:01:10 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

2022 වර්ෂයට අදාළව ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවට අයත් මාර්ග 09ක් මැනුම් කර ගැසට් කිරීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

| අනු අංකය | මාර්ගයේ නම | දළ දුර (කි.මී/මී) |
|---|---|---|
| 01 | ජයමාලපුර 10 වන පටුමග | 01Km |
| 02 | මුස්ලිම් විද්‍යාලය අසල සිට තලේගොඩ පිට්ටනිය හරහා පයනු වංගුව දක්වා පාර | 03km |
| 03 | වැලිකන්ද හන්දියේ සිට හැරකොළ දක්වා පාර | 03km |
| 04 | තැඹිලිගල විහාරස්ථානය අසලින් ඇත්ගාල නගරය යා කරන පාර | 01Km |
| 05 | ගම්පොලවෙල ගනේවත්ත පාර | 1.5km |
| 06 | පරගල ගම මැද ක්‍රීඩාපිටිය අසල සිට ගම මැද මාර්ගය කුලරත්න මහතාගේ නිවස අසල දක්වා පාර | 01Km |
| 07 | ගල්පාය සිට ගොවිපොල හරහා ලෙච්චමීවත්ත පාර | 4km |
| 08 | බොස්වෝඩ් පන්සල අසල සිට රහලගල දක්වා දිවෙන පාර | 2km |
| 09 | මීතලාව සිට උඩගම බෝමළුව දක්වා පාර | 1.5km |

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.සුමේධ අලුත්ගමගේ මහතා මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

2022 වර්ෂයට අදාළව ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවට අයත් ජයමාලපුර 10 වන පටුමග, මුස්ලිම් විද්‍යාලය අසල සිට තලේගොඩ පිට්ටනිය හරහා පයනු වංගුව දක්වා පාර, වැලිකන්ද හන්දියේ සිට හැරකොළ දක්වා පාර, තැඹිලිගල විහාරස්ථානය අසලින් ඇත්ගාල නගරය යා කරන පාර, ගම්පොලවෙල ගනේවත්ත පාර, පරගල ගම මැද ක්‍රීඩාපිටිය අසල සිට ගම මැද මාර්ගය කුලරත්න මහතාගේ නිවස අසල දක්වා පාර, ගල්පාය සිට ගොවිපොල හරහා ලෙච්චමීවත්ත පාර, බොස්වෝඩ් පන්සල අසල සිට රහලගල දක්වා දිවෙන පාර, මීතලාව සිට උඩගම බෝමළුව දක්වා පාර යන මාර්ග 09 මැනුම් කර ගැසට් කිරීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා. මේ පිළිබඳව අදහස් දැක්වීමට අවස්ථාව ලබා දෙනවා.

ගරු සභාපතිතුමා

මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව හා විරුද්ධත්වයක් නොමැති බව පෙනී යනවා.

තීරණය

2022 වර්ෂයට අදාළව ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවට අයත් ජයමාලපුර 10 වන පටුමග, මුස්ලිම් විද්‍යාලය අසල සිට තලේගොඩ පිට්ටනිය හරහා පයනු වංගුව දක්වා පාර, වැලිකන්ද හන්දියේ සිට හැරකොළ දක්වා පාර, තැඹිලිගල විහාරස්ථානය අසලින් ඇත්ගාල නගරය යා කරන පාර, ගම්පොලවෙල ගනේවත්ත පාර, පරගල ගම මැද ක්‍රීඩාපිටිය අසල සිට ගම මැද මාර්ගය කුලරත්න මහතාගේ නිවස අසල දක්වා පාර, ගල්පාය සිට ගොවිපොල හරහා ලෙච්චමීවත්ත පාර, බොස්වෝඩ් පන්සල අසල සිට රහලගල දක්වා දිවෙන පාර, මීතලාව සිට උඩගම බෝමළුව දක්වා පාර යන මාර්ග 09 මැනුම් කර ගැසට් කිරීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

06. යථාපරිදි කල්දී නොමැති යෝජනා /හදිසියෝජනා - ඇත

06:01 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව සභාගත කරන ලදි.

2021 වර්ෂයේ පළාත් පාලන ආයතනවල අත්‍යවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලද උලපනේ ඩෙන්මාර්ක් කසළ අංගනය වටා වැටක් ඉදිකිරීම ව්‍යාපෘතිය සඳහා සභාව වෙත ලැබී ඇති රුපියල් 1,937,202.48.00 ක මුදල ප්‍රගති ග්‍රාම සංවර්ධන සමිතිය - සිංහපුර වෙත ගෙවීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.පී. විශ්වජිත් ගංගා ප්‍රේමලාල් ගුරුගේ මහතා

එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමා

2021 වර්ෂයේ පළාත් පාලන ආයතනවල අත්‍යවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලද උලපනේ ඩෙන්මාර්ක් කසළ අංගනය වටා වැටක් ඉදිකිරීම ව්‍යාපෘතිය සඳහා සභාව වෙත ලැබී ඇති රුපියල් 1,937,202.48.00 ක මුදල ප්‍රගති ග්‍රාම සංවර්ධන සමිතිය - සිංහපුර වෙත ගෙවීම සුදුසු බවට ගරු මහා සභාවට යෝජනා කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී. ගුණරත්න මහතා

ගරු සභාපතිතුමනි, සභාවට අලාභයක් නොවන පරිදි අදාළ දඩ මුදල් අයකරගෙන ගෙවීම් කටයුතු කිරීම සුදුසුයි.

ගරු සභාපතිතුමා

මේ පිළිබඳව වෙනත් අදහසක් ඉදිරිපත් නොවන බව හා විරුද්ධත්වයක් නොමැති බව පෙනී යනවා.

තීරණය

2021වර්ෂයේ පළාත් පාලන ආයතනවල අත්‍යවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලද උලපනේ ඩෙන්මාර්ක් කසළ අංගනය වටා වැටක් ඉදිකිරීම ව්‍යාපෘතිය සඳහා සභාව වෙත ලැබී ඇති රුපියල් 1,937,202.48.00 ක මුදල ප්‍රගති ග්‍රාම සංවර්ධන සමිතිය - සිංහපුර වෙත ගෙවීම සුදුසු බවට ගරු මහා සභාව තීරණය කිරීමෙන් අනතුරුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

07 කාරක සභා වාර්තා සළකා බැලීම

07:01 මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව සභාගත කරන ලදි.

2022.09.13 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව සභා ගත කරන ලදි. ඒ අනුව 2022 වර්ෂයට අදාළ ආදායම් වියදම් පුරෝකථනයද, 2022 අගෝස්තු මස මුළු ලැබීම් රු:11,915,841.19ක්ද මුළු වියදම රු:7.753.556.07ක්ද විය. 2022 අගෝස්තු මසට අදාළ බැංකු සැසඳුම් ප්‍රකාශය 2022.09.09 වන දින මහනුවර විගණන අධිකාරී වෙත යොමුකර ඇත.

07:02 පරිසර හා පොදු පහසුකම් පිළිබඳ කාරක සභා වාර්තාව සභාගත කරන ලදි.

**08.** ගෙවීම් වාර්තාව

**2022.09.09** සිට 2022.09.14 දක්වා ගෙවීම් වාර්තාව සභාගත කරන ලදි.

ගඟ ඉහළකෝරළේ ප්‍රාදේශීය සභාවේ 2022.09.20 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව

| අනු අංකය | දිනය | ආදායකයා | ගෙවීම් විස්තරය | වවුචර් අංකය | හරස් සටහන් | මුදල |
|---|---|---|---|---|---|---|
| **1** | **2022-09-09** | ලේකම්, ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව | කොටගල ප්‍රාදේශීය සභාවේ ක්ෂේත්‍ර චාරිකාව සඳහා සංග්‍රහ හා අත්‍යවශ්‍ය වියදම් සඳහා ලබාගත් අත්තිකාරම් මුදල පියවීම. | 1006 | | **2,085.00** |
| **2** | **2022-09-12** | උලපනේවත්ත සමගි ග්‍රාම සංවර්ධන/සුභ සාධක සමිතිය, උලපනේ | 2022 වර්ෂයේ "ගම සමඟ පිළිසඳරක්" වැඩසටහන මගින් ක්‍රියාත්මක කරන ලද උලපනේ "ප" වංගුව අසල සිට සෝමසිරි මහතාගේ නිවස අසල පැති බැම්ම සංවර්ධනය කිරීම ව්‍යාපෘතියේ මුදල් ගෙවීම. | 1007 | **7,600.00** | **428,875.00** |
| **3** | | සමගි ග්‍රාම සංවර්ධන සමිතිය, බොස්වෝර්ඩ් | 2021 වර්ෂයේ පළාත් පාලන මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලද ගඟ ඉහළ කෝරළේ වැටකේදෙණිය කඩවීදියේ සිට උඩුවැල්ල දක්වා මාර්ගය සංවර්ධනය කිරීම ව්‍යාපෘතියේ මුදල් ගෙවීම. | 1008 | **55,994.46** | **428,087.86** |
| **4** | | ලේකම්, ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව | 2022 අගෝස්තු මස නිලධාරීන් සඳහා ලිපිද්‍රව්‍ය නිකුත් කිරීම ගිණුම්ගත කිරීම. | 1009 | | **96,169.49** |
| **5** | | දවස මධ්‍යස්ථානය ගම්පොළ | ඇත්ගාල මහජන පුස්තකාලයේ 2022 අගෝස්තු මාසයට මිලදීගත් පුවත්පත්වල බිල්පත ගෙවීම. | 1010 | | **6,200.00** |
| **6** | | සී/ස සමූපකාර රක්ෂණ සමාගම ගම්පල | **CPRW-6917** ට්‍රැක්ටර් ට්‍රේලරයේ 2022.09.05 සිට 2023.09.04 දක්වා වසරක කාලයක් සඳහා රක්ෂණ වාරික මුදල් ගෙවීම. | 1011 | | **4,610.41** |
| **7** | | සී/ස සමූපකාර රක්ෂණ සමාගම ගම්පල | **CPRW-0926** ට්‍රැක්ටර්යේ 2022.09.05 සිට 2023.09.04 දක්වා වසරක කාලයක් සඳහා රක්ෂණ වාරික මුදල් ගෙවීම. | 1012 | | **9,356.31** |
| **8** | | කේ.ඒ.අයි.එච්. වික්‍රමසිංහ මිය- සංවර්ධන නිලධාරි | නිවසේ අලුත්වැඩියා කටයුත්තක් සඳහා ආපදා ණය මුදල් ලබාදීම. | 1013 | **25.00** | **47,475.00** |
| **9** | **2022-09-13** | පී.පී.එස්.ජේ.කිත්සිරි මයා - පරිසර නිලධාරි | 2022 අගෝස්තු මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම. | 1014 | | **2,400.00** |
| **10** | | බී.පී.මිල්ටන්රත්න මයා - මාර්ග කම්කරු | 2022 - ජුලි මස අතිකාල දීමනා ගෙවීම (පැය 20.30) | 1015 | | **2,156.50** |
| **11** | | කේ.පී ක්‍රිශාන්ත සමන්සිරි මයා - මාර්ග කම්කරු | 2022 - අගෝස්තු මස අතිකාල දීමනා ගෙවීම (පැය 25) | 1016 | | **2,630.00** |
| **12** | | එන්.පී.එස්.එස්.සෝම තිලක මයා - රියදුරු | 2022 - අගෝස්තු මස අතිකාල දීමනා ගෙවීම (පැය 100) | 1017 | | **11,195.00** |
| **13** | | ලේකම්, ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව | සුළු මුදල් අග්‍රිමය පියවීම | 1018 | | **3,000.00** |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 14 | | පී.පී.එස්.ජේ.කිත්සිරි මයා - පරිසර නිලධාරී | හතුගොඩ විජයාරාම පෙර පාසලේ සහ ඇත්ගාල පෙර පාසලෙහි ළමුන් සඳහා 2022/09/14 සහ 2022/09/15 දිනවලදි පැවැත්වීමට සූදානම් කර ඇති කසළ කළමනාකරණය හා ඩෙංගු පාලනය සම්බන්ධ වැඩසටහන්වලට සහභාගි වන ළමුන් වෙනුවෙන් සංග්‍රහ කටයුතු කිරීමට මුදල් ලබා ගැනීම. | 1019 | | 3,000.00 |
| 15 | 2022-09-14 | ඇත්ගාල නැගෙනහිර ග්‍රාම සංවර්ධන සමිතිය - ඇත්ගාල | 2021 වර්ෂයේ පළාත් පාලන මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලද ඇත්ගාල නැගෙනහිර වසන්තා මහත්මියගේ නිවස අසලින් යන ගම මැද පාර සංවර්ධනය කිරීම ව්‍යාපෘතියේ මුදල් ගෙවීම. | 1020 | 56,190.70 | 429,598.01 |
| 16 | | ඇත්ගාල නැගෙනහිර ග්‍රාම සංවර්ධන සමිතිය-ඇත්ගාල | සභා අරමුදල් 2021 යටතේ ක්‍රියාත්මක කරන ලද ඇත්ගාල සමිති ශාලාව වැඩි දියුණු කිරීම ව්‍යාපෘතියේ අතරැදි මුදල් ගෙවීම. | 1021 | 25.00 | 69,924.25 |
| 17 | | ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩලය- කුරුඳුවත්ත කඩවීදිය | සභා අරමුදල් 2021 යටතේ ක්‍රියාත්මක කරන ලද ගිරාඋල්ල පූරාණ විහාරස්ථානයේ අතුරු මාර්ගය සංවර්ධනය කිරීම ව්‍යාපෘතියේ අතරැදි මුදල් ගෙවීම. | 1022 | 25.00 | 99,975.00 |
| 18 | | ග්‍රාම සංවර්ධන ප්‍රාදේශීය බල මණ්ඩලය- කුරුඳුවත්ත කඩවීදිය | සභා අරමුදල් 2021 යටතේ ක්‍රියාත්මක කරන ලද ලියන්නාවත්ත අතුරු මාර්ගය සංවර්ධනය කිරීම ව්‍යාපෘතියේ අතරැදි මුදල් ගෙවීම. | 1023 | | 24,565.54 |
| 19 | | වෙරෝනිකා මධුෂානි - සංවර්ධන නිලධාරි | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ඇත්ගාල උපකාර්යාලය සඳහා **Dongle** එකක් මිලදී ගැනීම සඳහා අතෙන් වියදම් වූ මුදල ගෙවීම. | 1024 | | 2,060.00 |
| 20 | | ලේකම්, ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව | ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ඇත්ගාල වෙළඳ සංකීර්ණයේ පොදු වැසිකිළියට අලුතින් වළක් කපා කොන්ක්‍රීට් කිරීම වෙනුවෙන් පෙදරේරු සහ කම්කරු දින 02ක් සඳහා මුදල් ගෙවීම. | 1025 | | 11,100.00 |
| 21 | | ධම්මික ප්‍රභාත් බණ්ඩාර මයා - ගම්පල | "සිව්වසරක හරසර" සේවක අභිප්‍රේරණ වැඩසටහනේ ඡායාරූප ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 1026 | | 8,000.00 |
| | | එකතුව | | | 119,860.16 | 1,692,463.37 |

## 09.වෙනත්

01. ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමියගේ මෑණියන්ගේ අවමංගල්‍ය උත්සවය සඳහා සහභාගි වූ හා උපකාර කළ ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයට සහ කාර්යය මණ්ඩලයට ස්තූති පුදකිරීමේ ලිපිය ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

ගරු සභාපතිතුමා

අද දින මහා සභා රැස්වීම සඳහා පැමිණි ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා හා ගරු මන්ත්‍රීතුමියන්ලාට ස්තූතිවන්තවන බව ප්‍රකාශ කරන ලදි. අද දින සභාවාරය සාර්ථකව පවත්වාගෙන යාමට සහය ලබාදුන් සියලුදෙනාටත් ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය ඇතුළු කාර්යය මණ්ඩලයේ සියලුදෙනාටත් ස්තූතිවන්ත වෙමින් ගරු සභාපතිතුමා විසින් සභාවේ වැඩ කටයුතු පෙ:ව: 12.00 ට අවසන් කරන ලදි.

සභාපති

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාව

2022.09.20 වන දින ගඟ ඉහළ කෝරළේ

ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදිය